# 2015.02.10 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රැස්වීම් වාර්තාව

සහභාගීත්වය (-

| | | |
|---|---|---|
| ☞ | ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා | ගරු සභාපති |
| ☞ | කමල් වැල්ලගේ මහතා | ගරු උප සභාපති |
| ☞ | ඒ.පී.ලක්ෂ්මි හේමන්තා සිල්වා මෙනවිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ | එච්.එල්. අනුර කිත්සිරි මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ | ජී.සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ | ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ | ඒ. ඩබ්. ජගත් කුමාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ | ජේ.ඩබ්.හාෂිණි මෙනුකා විජේසූරිය මහත්මිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ | ජේ.ඩබ්.ජයන්ත මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ | ආර්.පී.දේව් රොහාන් ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ | බී.ජනිත් වික්‍රමතිලක මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ | කේ.පුෂ්පික ඉන්ද්‍රජිත් මහතා | ගරු නගර සභා මන්ත්‍රී |

☸ **පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව පෙ.ව. 09.35 ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී** ☸

## (01) 2015.01.06 දින පවත්වන ලද සාමාන්‍ය මාසික සභා රැස්වීම් වාර්තාව ස්ථිර කිරීම

**01:01** 2015 .01.06 දින පවත්වන ලද සාමාන්‍ය මාසික සභා රැස්වීම් වාර්තාව කියවූවා සේ සලකා පිළිගත යුතු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

සංශෝධනයක් නිළධාරිනිය විසින්ම ඉදිරිපත් කරලා තියෙනවා.2015.01.06 වන දින සභා වාර්තාවේ 4 වන පිටුවේ පළමුවන ඡේදයේ දෙවන පේළියේ අම්බලන්ගොඩ නගර සභාවේ හිටපු සභාපතිතුමාගේ නම

වැරදීමකින් ජේම්ස් සිල්වා ලෙස සටහන් වී ඇති අතර එය ජී.එම්.එස්.ද සිල්වා ලෙස සංශෝධනය විය යුතුය කියලා සඳහන් කරලා තියෙනවා.ඒ සංශෝදනයට යටත්ව වාර්තාව සම්මත කරනවා.

✠ **ඒ අනුව 2015 – 01 – 06 දින පවත්වන ලද සාමාන්‍ය මාසික සභා රැස්වීම් වාර්තාව මෙම සංශෝධනයට යටත්ව ඒකමතිකව ස්ථිර විය.**

## (02) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන

ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා රිය අනතුරකට ලක්ව අසනීප තත්වයෙන් පසු වන බැවින් අද දින මාසික සභාවට සහ ඉදිරි කමිටු රැස්වීම් සඳහා සහභාගී විය නොහැකි බව දුරකථනයෙන් දැණුම් දෙන ලදී.

## (03) ලැබී ඇති පැමිණිලි පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම

**3:1** ‘ අ.ම.කරුණාරත්න ගොඩනැගිල්ලේ පවත්වන බෞද්ධ කාන්තා සංගමයට පුටු ලබා ගැනීම ’ මැයෙන් අම්බලන්ගොඩ බෞද්ධ කාන්තා සංගමයේ සභාපති විසින් එවා තිබූ ලිපිය සභාගත කිරීම.

2015.01.24 වන සෙනසුරාදා දින සවස 2.30 ට පවත්වනු ලබන රැස්වීම සඳහා පුටු 50 ක් නොමිලේ ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් අ.ම.කරුණාරත්න ගොඩනැගිල්ලේ පවත්වන බෞද්ධ කාන්තා සංගමයට ,සභා ආවරණ අනුමැතියට යටත්ව ගාස්තු අය කිරීමකින් තොරව පුටු 50 ක් ලබා දීම වෙනුවෙන් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**3:2** ‘ නගර සභා ක්‍රිකට් ඇකඩමිය සඳහා පුහුණු කරුවෙක් ලබා ගැනීම ’ මැයෙන් ක්‍රීඩා භූමි උපදේශක ජී.අශෝක කුමාර මහතා විසින් එවා තිබූ ලිපිය සභාගත කිරීම.

ක්‍රිකට් ඇකඩමියේ පුහුණුව ලබන ක්‍රීඩකයන් ප්‍රමාණය වැඩි වීම නිසාවෙන් අශෝක මහතා සමඟ සහන් සංකල්ප යන අය පුහුණුකරුවකු වශයෙන් අවුරුදු එකහමාරක් පමණ කාලයක් කටයුතු කරමින් සිටින බවත් ඒ වෙනුවෙන් මාසික වේතනයක් ලබා දීමට කටයුතු කරන මෙන් ඉල්ලා තිබුණි.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේ සම්බන්ධයෙන් ප්‍රජා සංවර්ධන නිළධාරීනියගේ නිර්දේශය තියෙනවා.ප්‍රදේශයේ ක්‍රිකට් ක්‍රීඩාව සඳහා උනන්දුවක් දක්වන පාසල් ක්‍රිකට් ක්‍රීඩකයන්ගේ දක්ෂතා දියුණු කිරීම මඟින් ක්‍රිකට් ක්‍රීඩාව ඉහළට ගෙන ඒමට නගර සභා ක්‍රිකට් ඇකඩමිය ආරම්භ කරන ලදී.මේ වන විට ළමුන් 60 ක් පමණ පුහුණු වෙමින් පවතින අතර එක් පුහුණු කරුවෙකුට පුහුණු කටයුතු සිදු කිරීම අපහසු බවත් 2010 වසරේ ගාලු දිස්ත්‍රික් ක්‍රිකට් ඇකඩමියෙන් පුහුණුකරුවන් 2 කු ලබා දෙන ලෙස ලිඛිතව ඉල්ලීම් කළද ඒ සඳහා මෙතෙක් පිළිතුරක් නොමැති බවත් එබැවින් පුහුණු කිරීමේ කටයුතු සඳහා සහන් සංකල්ප යන අය වසර 1 1/2 පමණ සහභාගී වී ඇති බවත් ඒ වෙනුවෙන්

ඔහුට කිසිදු ගෙවීමක් සිදු නොකලද ඔහු අඛණ්ඩව උනනුදුවෙන් පැමිණ පුහුණුවීම් කටයුතු සිදු කරන බවත් එනිසා ඔහුට දීමනාවක් ලබා දීම සුදුසු බව යෝජනා කරලා තියෙනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**
සභාපතිතුමා,යසරත්න මහත්මයත් පුහුණු කටයුතු වලට ඉන්නවා නේද?

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**
යසරත්න පුහුණු වීම් කටයුතු වලට පැමිණෙන්නෑ.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ඇයි යසරත්න මහත්මයා මේ දේවල් වලට සහභාගී නොවන්නේ.ඔහුටත් මෙහි සේවකයෙක් විදියට වගකීමක් තියෙනවානේද මේ දේවල් කරන්න.ඔහු පැමිණෙන් නෑ කියලා කියන්නේ ඇයි සභාපතිතුමණි.නිළධාරීන් දැන ගන්න ඕන ඔවුන්ගෙන් අවශ්‍ය වැඩ ගන්න.ඇයි නිළධාරීන් ඔහුට විරුද්ධව ක්‍රියා මාර්ගයක් නොගන්නේ කියලා අපට අහන්න වෙනවා.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අශෝක කුමාර මහත්තයා ලබන වැටුපට අමතරව මේ දේ සේවාවක් විදියට කරනවා.මම පුද්ගලිකවත් කතා කරලා කියලා තියෙනවා යසරත්න මහත්මයටත් මේ දේ  කරන්න කියලා.මුල් කාලයේ දවස් 2-3 ක් ආවා.පහුවෙන කොට එන්නෑ.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

අශෝක කුමාරත් පුහුණුකරුවෙක් නෙවෙයි.ඔහුත් සේවකයෙක් මේ සභාවේ.ඔහු සේවාවක් විදියට කරනවනම් ඇයි යසරත්න මහත්මයාට බැරි.මම දන්න විදියට යසරත්න මහත්මය පොත අත්සන් කරලා ගෙදර යනවා.මම කීප සැරයක්ම ලොග්එන්ට්‍රි ගැහුවත් කිසිම ක්‍රියා මාර්ගයක් ගත්තේ නෑ.මම අහන්නේ ඇයි ගන්න පුලුවන් සේවාව ගන්නේ නැත්තේ කියලා.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නිවරදිව සේවාව ඉටුකරන්නැත්නම් ඒක සොයලා බලලා කටයුතු කරන්න.මේ සේවකයට කීවට වැඩක් නෑ.විපක්ෂේ මන්ත්‍රීවරුත් දන්නවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**
එහෙම නම් අපි ලැජ්ජ වෙන්න ඕන පාලකයන් විදියට.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**
පාලකයන් වශයෙන් අපි ලැජ්ජ වෙන්න දෙයක් නෑ.මොකද ඒකට ලේකම් මහත්තයා ප්‍රමුඛ නිළධාරී මණ්ඩලයක් ඉන්නවා.මේ ලිපිය සම්බන්ධයෙන් විරෝධතාවයක් තියෙනවද?

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

මේ දේ සම්බන්ධයෙන් අපේ විරෝධතාවයක් නෑ.අම්බලන්ගොඩ නගරයෙන් දක්ෂ ක්‍රිකට් ක්‍රීඩකයෝ බිහි වුණා.උපුල් තරංග.දිනේෂ් චන්දිමාල් ,සමන් ජයන්ත,අජිත් සිල්වා වගේ ලෝක ප්‍රසිද්ධ ක්‍රීඩකයෝ අම්බලන්ගොඩ නගරයෙන් බිහි වුණා.දක්ෂ ක්‍රීඩකයෝ පුහුනු කරලා ජාතික තලයට යවන එක නගර සභාවේ අපේ වගකීම.එනිසා ඒ දේ වෙනුවෙන් කරන්න පුලුවන් දේට අපේ විරුද්ධත්වයක් නෑ.නමුත් වැඩ කරන්නැති සේවකයන් ඉන්නව නම් ඒ සම්බන්ධයෙන් ක්‍රියා මාර්ග ගත යුතු වෙනවා.ඒ සඳහා මැදිහත් වෙන්න කියලා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්**

යසරත්න මහත්මයට රාජකාරී සම්බන්ධව කුමක් හෝ ලියවිල්ලකින් දීලා ඇති.ඒකේ තියෙනවද පුහුණු කරුවෙක් විදියට වැඩ කරන්න කියලා.ඔහුගේ සේවා ලැයිස්තුවේ නැතිනම් අපට එහෙම බලකරන්න බෑ කරන්න කියලා.අශෝක මහත්තයත් නොකළය කියලා දොස් කියන්න බෑ අපට.ලේකම් මහත්තයා බලන්න යසරත්න මහත්තයගේ සේවාව ලබා ගන්න ඔහුට කියලා.දේවානන්ද මහ විද්‍යාලයේ ක්‍රිකට් පුහුනු කරුවෙක් විදියට යසරත්න මහත්තයා කාලයක් කටයුතු කළා.ඔහුත් හොඳ ක්‍රීඩකයෙක්.

- **ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා සහ ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහාන් ද සිල්වා මහතා පෙ.ව.9.49 ට පමණ ගරු සභාවට පැමිණෙන ලදී.**

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
මේ ඉල්ලීම සම්බන්ධයෙන් මොකද කියන්නේ.කීයක දීමනාවක්ද ලබා දෙන්නේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්</u>

සභාවේ වර්තමාන මුදල් තත්වය සැලකිල්ලට අරගෙන දීමනාව තීරණය කරන්න.ලොකු ගාණක් ගෙවන්න බෑ අපට.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
ආරම්භක දීමනාවක් ලෙස රු.7500.00 ක් ගෙවමුද අපි.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් නගර සභා ක්‍රිකට් ඇකඩමියේ පුහුණු කටයුතු වල නිරත වී සිටින සහන් සංකල්ප යන අයට මෙම මස සිට රු.7500.00 ක දීමනාවක් ලබා දීමට ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

- **ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා පෙ.ව.9.57 ට පමණ ගරු සභාවට පැමිණෙන ලදී.**

**3:3** ‘ පොදු වෙළද පොළ කඩ කාමර අංක 70 පවරා ගැනීමට කැමැත්ත ප්‍රකාශ කිරීම’ මැයෙන් අම්බලන්ගොඩ ,පොල්වත්ත,නො.9/2 තල්ගස්ගොඩ පාරේ පදිංචි පී.එච්.ඉරෝෂා තුෂාරී මිය විසින් එවා තිබූ ලිපිය සභාගත කිරීම.

අම්බලන්ගොඩ පොදු වෙළඳපොල අංක 70 දරණ කඩය එහි වර්තමාන බදු ගැණුම්කරු වන එස්.ඩබ්.සුනිල් ප්‍රේමලාල් යන අයගෙන් පවරා ගැනීමට කැමැත්ත ප්‍රකාශ කරමි යනුවෙන් සඳහන් කර තිබූ අතර නගර සභා නීති රීති වලට අනුකූලව කඩ කාමරය පවත්වාගෙන යාමට සහ නිසි පරිදි මුදල් ගෙවීමටද මින් එකඟ වන බව සඳහන් කර තිබුණි.
අම්බලන්ගොඩ ,පටබැදිමුල්ල ,කන්ද මාවත අංක 39 ලිපිනයේ පදිංචි සෙම්බකුට්ටි විදාන සුනිල් ප්‍රේමලාල් වන අය විසින් අම්බලන්ගොඩ පොදු වෙළඳපොල අංක 70 දරණ කඩය , අම්බලන්ගොඩ ,පොල්වත්ත,නො.9/2 තල්ගස්ගොඩ පාරේ පදිංචි පී.එච්.ඉරෝෂා තුෂාරී යන අයට බදු අයිතිය පැවරීමට කැමැත්ත ප්‍රකාශ කර දිවුරුම් ප්‍රකාශයක්ද ලබා දී තිබුණි.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ඒ අනුව නව කඩ කුලිය රු.900.00 ක් ලෙසත් එක්වන් වාරිකය 90000.00 ක් ලෙසත් අය කර ගැනීම සුදුසුයි කියලා ආදායම් පරීක්ෂක වාර්තා කරලා තියෙනවා.රු.900.00 ක බදු මුදලට ලංකාවේ කොහේවත් කඩ කුලියට දෙන්නෑ.ඇයි ප්‍රායෝගික බදු මුදලකට මේක ගේන්න බැරි.පේමන්ට් එකේ ඉන්න මනුස්සයගෙනුත් රු.1000.00 ක් ගන්නවා.රු.900.00 ට කඩ කුලිය තීරණය කළාම නගර සභාව කඩන් වැටෙන එක අහන්න දෙයක් නෑ.පයෝදා එක ඉස්සරහා පේමන්ට් එකේ ඉන්න කෙනා පයෝධා එකට රු.1000.00 ක් ගෙවනවා.එනිසා බදු තීරනය කරන කොට ප්‍රායෝගිකව තීරණය කරන්න.නගරයේ ඇවිදලා බලන්න.

තීරණය

**ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් පොදු වෙළද පොළ කඩ කාමර අංක 70 බදු කුලී අයිතිය ආදායම් නිළධාරීන්ගේ නිර්දේශයන් පරිදි ,අම්බලන්ගොඩ ,පොල්වත්ත,නො.9/2 තල්ගස්ගොඩ පාරේ පදිංචි පී.එච්.ඉරෝෂා තුෂාරී මියට ලබා දීමට ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**3:4** ' අන්තර් දහම් පාඨශාලාන්තර රචනා තරඟය හා දහම් මිනුම් විචාර තරඟය 2014 ජයග්‍රහකයින් සඳහා ත්‍යාග හා සහතිකපත් පිරිනැමීමේ උත්සවය සඳහා නගර ශාලාව ලබා ගැනීම ' මැයෙන් අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය විසින් එවා තිබූ ලිපිය සභාගත කිරීම.

අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය දෙවන වරටත් සංවිධානය කරනු ලැබූ අන්තර් පාඨශාලීයිය රචනා තරඟය සහ දහම් දැනුම මිණුම ප්‍රශ්න විචාරාත්මක තරඟයේ ජයග්‍රහකයින් සඳහා ත්‍යාග හා සහතික පත් පිරිනැමීමේ උත්සවය සමස්ථ ලංකා බෞද්ධ මහා සම්මේලනයේ සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2015.01.25 වන දින ප.ව. 2.00 ට අම්බලන්ගොඩ නගර ශාලාවේ පැවැත්වීමට අදහස් කර ඇති බවත් ,එබැවින් 2015.01.25 වන දින ප.ව.12.00 සිට ප.ව. 6.00 දක්වා අම්බලන්ගොඩ නගර සභාව නොමිලයේ ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

තීරණය

**ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමයට සභා ආවරණ අනුමැතියට යටත්ව 2015.01.25 වන දින ගාස්තු අය කිරීමකින් තොරව නගර ශාලාව ලබා දීම වෙනුවෙන් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**3:5** ' 23 වන වරටත් ඉදිකරණ වන්දණීය වෙසක් තොරණ - අම්බලන්ගොඩ තානායම අසල ඉදිකිරීමට' මැයෙන් සී.ඩ්‍රැගන්ස් බෞද්ධ සමිතිය විසින් එවා තිබූ ලිපිය සභාගත කිරීම.

තොරණට ආධාර පිණිස සංවිධානය කරන මැරිගෝරවුම සහ පුංචි කෝච්චිය අම්බලන්ගොඩ තානායම් භූමියේ සංවිධානය කිරීමට අවසර ඉල්ලා තිබූ අතර විනෝද බද්දෙන් සමිතිය නිදහස් කරන ලෙසද ඉල්ලා තිබුනි.

තීරණය

- **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොවූ බැවින් තනායමේ ඉදිකිරීම් කටයුතු වලට අවහිරයක් නොවන පරිදි සහ තානායමේ ඉදිකිරීම් කටයුතු සිදු කරන කොන්ත්‍රාත් සමාගම ඉදිකිරීම් කටයුතු වලට පැමිණිය හොත් වහාම කටයුත නවත්වන කොන්දේසියට යටත්ව සී.ඩ්‍රැගන් බෞද්ධ සමිතියට තොරණට ආධාර පිණිස සංවිධානය කරන මැරිගෝරවුම සහ පුංචි කෝච්චිය තානායම් භූමියේ සවි කිරීමට අවසර ලබා දීමට ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

## (04) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න

**4:1** ගරු නගර සභා මන්ත්‍රී බී.ජනිත් වික්‍රමතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්න.

**1)** කෙරමිණිය පින්නදූව ක්‍රීඩාංගනය සහ අත්පත් කර ගැනීමට යෝජිත කෙරමිණිය නගර සභා පෙර පාසල සහ පුස්තකාලය පිහිටි ඉඩමට නැගෙනහිර මායිමේ පිහිටි ඉඩම පවරා ගැනීමට කටයුතු යොදා ඇද්ද? **ඔව්**

**2)** එම පවරා ගැනීම සඳහා තක්සේරු වාර්ථාවක් ලබා ඇද්ද? **ඔව්**

**3)** එසේ තක්සේරුවක් ලබා ගෙන ඇත්නම් එකී ඉඩම සඳහා ගෙවිය යුතු වටිනාකම කොපමණද? **2009.09.16 දිනට ,රු.250000.00**

4) එකී ඉඩම අත්පත් කර ගැනීමේ මූලික කටයුතු සඳහා දකුනු පළාත් සභාව විසින් අම්බලන්ගොඩ නගර සභාව වෙත කොපමණ මුදලක් ලබා දී ඇද්ද? රු.**800000.00**

**5)** යෝජිත ක්‍රීඩාංගනය ඉදිකිරීමේ කටයුතු ප්‍රමාද වීමට හේතු කවරේද? **වනසත්ව හා වෘක්ෂලතා ආඥාපනත අනුව, මෙම ඉඩම ගොඩ කිරීම නිත්‍යානුකූල නොවන නිසා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අවසරය මේ සඳහා ලැබී නොතිබීම.(මේ පිළිබඳව 2011.05.03 දිනැති මාසික සභාව දැණුවත් කර ඇති)**

## (05) යථා පරිදි කල් දී ඇති යෝජනා

**5:1** **ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන යෝජනා (නිළධාරීන් විසින් සකස්කරන ලද පරිපාලන යෝජනා) :-**

**5:1:1** “ කසල බැහැර කිරීම වෙනුවෙන් අය කරන මුදල් සේවය ලබා නොගැනීම හේතුවෙන් ආපසු ගෙවීම සඳහා වන යෝජනාව.

කසල බැහැර කිරීම සඳහා මුදල් ගෙවා තිබියදී යම් ප්‍රමාද දෝෂයක් මත එම සේවය සැපයීමට නොහැකි වන අවස්ථාවක දී ඒ වෙනුවෙන් අය කරන ලද මුදලින් රජයේ බදු මුදල් අඩු කරගෙන ඉතිරි මුදල් ආපසු ගෙවීම සුදුසු බව ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

කසල අදින්න අපි මුදල් අය කරත් විවිධ හේතු මත කසල අදින්න බැරි වෙනවා.ට්‍රැක්ටර් කැඩුනම එහෙම අදින්න බෑනේ.එහෙම වුනාම ඒ මුදල් ආපසු ගෙවන්න අනුමැතිය ඉල්ලන්නේ.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

මේකේ ගැටලුව තියෙන්නේ අපි අය කරන මුදල ඉතාමත් අඩුයි.

ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

නෑ අපි ගාස්තු සංශෝධනය කළා.ගැටලුව තියෙන්නේ ට්‍රැක්ටර් එහෙම කැඩුනම අපට අදින්න බැරි වෙනවා.එවැනි අවස්ථාවල නැවත ගෙවන්න ඉල්ලන්නේ.නැතිනම් නැවත ගෙවීමක් වශයෙන් හැම එකක්ම නැවත සභාවට එවන්න එපැයි.

තීරණය

**ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් කසල බැහැර කිරීම වෙනුවෙන් අය කරන මුදල් සේවය ලබා නොගැනීම හේතුවෙන් රජයේ බඳු මුදල් අඩු කරගෙන ඉතිරි මුදල් ආපසු ගෙවීමේ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

**5:1:2** "පළාත් පාලන ආයතන සඳහා යන්ත්‍රෝපකරණ ඒකක පිහිටුවීම _නව තනතුරු අනුමත කිරීම (මු.රෙ.77) " සඳහා වන යෝජනාව.

උක්ත කරුණ සම්බන්ධයෙන් දපපා/ආ/06/03 පොදු හා 2015.01.19 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ ලිපිය අනුව රියදුරන් සහ යන්ත්‍රෝපකරණ ක්‍රියාකරුවන් බඳවා ගැනීම සඳහා කළමණාකරන චක්‍ර ලේඛ 03/2014 අනුව අයදුම්පත් සකස් කර සහා තීරණයක් සමඟ එවන ලෙස දන්වා ඇති බවත් ඒ අනුව දැනට අනුමත රියදුරු සංඛ්‍යාව 10 ක් බවත් 25/2014 චක්‍ර ලේඛය අනුව ස්ථිර කරනු ලැබූ රියදුරන් 5 ද සමඟ ස්ථිර රියදුරු සංඛ්‍යාව 12 ක් බවත් මේ වන විට වාහන 17 ක් සහ යන්ත්‍රෝපකරණ 04 ක් සභාව සතුව පවතින බවත් තවදුරටත් රියදුරන් 05 ක් සහ යන්ත්‍රෝපකරණ ක්‍රියාකරුවන් 03 ක් අවශ්‍යව ඇති බැවින් එම බඳවා ගැනීම් සිදු කිරීම සුදුසු බව ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

තීරණය

**ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් රියදුරන් 05 ක් සහ යන්ත්‍රෝපකරණ ක්‍රියාකරුවන් 03 ක් සඳහා නව තනතුරු ඇති කිරීමේ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

**05:02** **ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා :-**

**5:2:1** ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව.

" ශ්‍රී ලංකාවේ 6 වන විධායක ජනාධිපතිධූරයට පත් අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාටත් , තුන් වන වතාවටත් ශ්‍රී ලංකාවේ අග්‍රමාත්‍යධූරයට පත් ගරු රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාටත් රට තුළ යහ පාලනයක් සමඟ ජනතාවට සහන සලසා රට සංවර්ධනය කිරීමට ධෛර්ය ශක්තිය සමඟ නිදුක් නිරෝගීභාවය ලැබී තෙරුවන් සරණින් සියලු දෙවි පිහිටෙන් රටට සේවය කිරීමට හැකිවේවායි අම්බලන්ගොඩ නගර සභාව සමඟ ජනතාවගේද සුභ පැතුම් මින් පුද කර සිටියයි ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා ස්ථිර කරන ලදී.

ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්

ප්‍රධාන පක්ෂ 2 න් මහින්ද රාජපක්ෂ මහතා සහ එ.ජා.පක්ෂය සමඟ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමත් තව කුඩා පක්ෂත් මේ තරඟයට ඉදිරිපත් වුනත් මේ 2 අතර තමයි තරඟය තිබුනේ.අපි එ.ජා.පක්ෂය, පක්ෂයක් විදියට තීරණය කරලා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට සහයෝගය දීමට තීරනය කළා.අපේ පක්ෂ නායකයා තමන්ට

තිබුණු අවස්ථාව නැති කරගෙන පොදු අපේක්ෂකයෙක් විදියට මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට උදව් කලා.මේක උණුසුම් තරඟයක් වුණා.ජනතාව තුළ සැඟවී තිබූ දේවල් එළියට ආවා මේ අවස්ථාවේ.හිටපු ජනාධිපතිතුමාට තව වසර 2 ක් තිබුණා.නමුත් ව්‍යවස්ථාව වෙනස් කරගෙන 3 වතාවටත් ඉදිරිපත් වුනා.මේක ලොකු ප්‍රශ්නයක් වුණා ලාංකිකයන්ට.මොකද වාර 2 යි ලෝකයේ ඕනෑම රටක ජනාධිපති කෙනෙක් ඉන්නේ.ඉතින් මෙහිදී උගත් බොහෝ දෙනෙක්ගේ මතය වුනේ 2කට වඩා ජනාධිපති ලෙස සිටිය යුතු නැතෙයි කියන එක.එනිසා ලක්ෂ 62 මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ගන්න කොට ලක්ෂ 59 මහින්ද රාජපක්ෂ ගත්තේ.සමහර අය කීවා යාපනයේ මුස්ලිම් ,දෙමල ජන්ද වලින් ජයග්‍රහනය කරයි කියලා.නමුත් මේ ජයග්‍රහනය කළේ සිංහල බෞද්ධ ,මුස්ලිම්, දෙමළ කියන සියලුම දෙනාගේ සහයෙන් එතුමා දිනුවේ.අපි එදා මේ ආසනය ඉලක්කම් 5 න් පැරදුනේ.මේ සැරේ අපි ඒක 6000 ගානට බස්සගෙන තියෙනවා.එකම විදියට ගිය පාලනය වෙනස් කරන්න ජනතාවට ඕන වෙලා තිබුණා.පිටරට පවා ඉදලා මිනිස්සු ඇවිත් තිබුනා ජන්දේ දාන්න.මට කීවා අපිත් එක්ක තව 15 ක් ආවා කියලා.තැපැල් ජන්ද දිහා බැලුවමත් තේරෙනවා වෙනදා මහින්ද රාජපක්ෂට වැටුන ජන්ද මේ පාර මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට වැටුණා.මත්කුඩු.එතනෝල්,මුදල් නාස්තිය වගේ දේවල් නිසා ජනතාව කල කිරිලා හිටියේ.බඩු මිළ ඉහල ගිහිල්ලා බොහෝ දෙනෙක්ට මේ දේට මුහුණ දෙන්න බැරි නිසා මේ තීරනය ගත්තා.අපේ පක්ෂේ දින 100 වැඩ සටහන යනවා දැන්.දැනට ඒකේ කොටසක් කෙරිලා තියෙනවා.තව කොටස් කෙරෙන්න තියෙනවා.ඒක හරියට කෙරුනොත් මම හිතනවා යහ පාලනය ඇති වේවී කියලා.ශ්‍රී.ල.නි.පක්ෂයත් මේ සඳහා උදවු කරලා තියෙනවා.ඒක හොදයි පක්ෂ භේද අමතක කරලා මේ දේට සහයෝගය ලබා දෙන එක.මොකද රටට යහපතක් ,යහ පාලනයක් ඇති වෙනවනම් අපි ඒ දේට සහයෝගය දක්වන්න ඕන.රට අද වැටිලා තියෙන තත්වයෙන් මුදා ගන්න නීති රීති හදලා සංවර්ධනයත් සමඟ විනයත් සහිත පාලනයක් ඇති කරලා රට දියුණු කරන්න ජන්දය දීපු සියලු දෙනාටම අම්බලන්ගොඩ නගර සභාව විදියට සියලු දෙනාටම ස්තූතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී බී.ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්</u>**

සමස්ථයක් වශයෙන් රටේම ජනතාව මෛත්‍රී පාලනයක් උදෙසා  අත් වැල් බැදගත් මොහොතක ඒ සම්බන්ධයෙන් ස්තූති කරීමේ යෝජනාවක්  අම්බලන්ගොඩ නගර වාසීන් වෙනුවෙන් කරන්නට ලැබීම ගැන් මම සතුටු වෙනවා.පසු ගිය මැතිවරණය ගත්තම ඉතාමත් ගැටලු සහිතව රජයේ දේශපාලන හස්තය ඔඩු දුවපු යුගයක තමයි අපට  මේ ජන්දෙට මුහුණ දෙන්න වුණේ.ඒ අතින් බැලුවම මෛත්‍රීපාල සිරිසේන මහත්මයා හැට දෙලක්ෂ දාහත්දාස්  එකසිය හැට දෙකක් ලබා ගනිමින් 51.82 % ක ප්‍රතිශතයක් ලබා ගත්තා.ඒ වගේම හිටපු මහින්ද රාජපක්ෂ මහත්තයා පනස් හත් ලක්ෂ හැටදාස් අනූවක් ලබා ගෙන 47.58% ප්‍රතිශතයක් ලබා ගෙන වැඩි ජන්ද භාරලක්ෂ හතලිස් නවදහස් හතලිස් දෙකකින් අපට ඔහු ජනාධිපති ධූරයට පත් කරන්න පුලුවන් වුණා.ඔහු ඉතිහාස ගත වෙනවා.මොකද රටේ අගමැති කෙනෙක් නොවී ජනාධිපති වුණ ප්‍රථම පුද්ගලයා ඔහු.ඒ වගේම එහු පක්ෂ නායකයකුත් නෙවෙයි.සියලුම අභියෝග මැද ඔහු ජනාධිපතිවරයා ලෙස පත් වීම ඇත්තටම භාග්‍යයක්.එසේම රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා 2 පාරක් අගමැති ධූරය දරලා 3 වන වරටත් අගමැති බවට පත් වෙනවා.ඒකත් විශිෂ්ට ජයග්‍රහනයක්.මේ දෙපළ කැබිනට් එකත් පත් කරලා ප්‍රථම වතාවට ජාතික රජයක් සමග මේ රජය යහ පාලනයක් සඳහා ගමන් කරමින් සිටින්නේ.මේ දින 100 වැඩ සටහනේ සමහරක් අංග එහාට මෙහාට වෙන්න පුලුවන් .නූලටම ඒ දේවල් සිදුවෙන්නෑ.නමුත් ඒ දින 100 දි අපි විශ්වාස කරනවා රටක දේශපාලනය කරන්න පුලුවන් වාතාවරනයක් උදා වේවී.රටක ස්වාධීනව දේශපාලනය කරන්න අයිතිය තියෙන්න ඕන.ඒ වගේම රාජ්‍ය සේවකයින්ටත් ඒ නිදහස තියෙන්න ඕන.රාජ්‍ය දේපල දූෂිතම ලෙස යොදා ගත්ත මැතිවරණය තමයි පහු ගිය මැතිවරණය.අද රූපවැහිනිය ගත්තත් ඒවාට ගෙවන්න තියෙනවා වීශාල මුදල් ප්‍රමාණයක්.සී.ටී.බී.එක ගත්තත් ඒවා භාවිතයට අරගෙන විශාල මුදල් ප්‍රමාණයක් තියෙනවා ගෙවන්න.රාජ්‍ය මුද්‍රණ සංස්ථාව ගත්තත් ඒ වගේ.මේ වගේ රාජ්‍ය දේපල විශාල වශයෙන් දූෂිත විදියට යොදා ගත්ත යුගයක් මේක.ස්වාධීන අධිකරණ කොමිසම, ස්වාධීන මැතිවරණ කොමිසම ස්ථාපිත කරලා 17 වන ව්‍යස්ථාව සංශෝධනය මඟින් ගෙනාපු කොමිසම් අහෝසි කලා ,නැවතත් මේ කොමිසම් බලගන්වලා රටක දේශපාලනය කරන්න පුලුවන් වාතාවරණයක් ඇති කරන එක තමයි අපේ එකම පැතුම.රාජ්‍ය දේපල භාවිතා කරන එක  අම්බලන්ගොඩ නගරයේත් වුණා.මේ ඊයේ පෙරේදා ඔබතුමන්ලගේ  පෝස්ටරයක් ගැහුවා මේ නගර සභාවේ නිළධාරීන් යොදාගෙන කළේ.නගර සභාවේ ත්‍රීවීල් රථය මේ සඳහා යොදාගෙන තියෙන්නේ.මම වගකීමෙන් කියන්නේ.අපි ඡායාරූපගත කරලා තියෙන්නේ.ලේකම්තුමා ඇතුලු නගර සභාවේ නිළධාරීන් දේශපාලන හස්තයට හසු වෙලා හිටියේ පසු ගිය දිනවල.එනිසා භයට දේවල් කළා.මම මේ සභාවේදී නිළධාරීන්ට අවධාරණය කරලා කියනවා දැන් ඒවා නවතන්න.මොකද එදා ඒ දේ කීවේ එක්කෙනා වුනාට අද ඒක 3-4 දෙනෙක් කියන තත්වෙට පත්වෙලා තියෙනවා.ජී.එම්.එස්.ද සිල්වා මහතාගේ කාලයේ මම දේශපාලනයට ආවේ.අපි එකම රාජ්‍ය දේපලක් වත් දේශපාලනයට යොදාගත්තේ නෑ.අපි ඕනනම් ඉණිමඟ ගන්න ඇති.ඒ ගත්තත් පොතේ ලියලා  සිකියුරිටි එකට කියලා අත්සන් කරලා අරගෙන ආපහු අත්සන් කරලා භාරදුන්නේ.අපි සේවකයන් යොදාගත්තේ නෑ.ඉතින් මේ වගේ වැරදි වෙනවා.ඉදිරියටත් මේවා සිදු වුනොත් අපි මේ සේවකයන් සඳහා දැඩි ලෙස ක්‍රියාකරනවා.එනිසා ලේකම් මහත්තයා ඒ සේවකයන්ට දැනුම් දීලා තියන්න.තමුන්නාන්සේ  යටතේ තියෙන නගර සභාවේ යාන වාහන පරිස්සම් කරලා තියාගන්න.මම මේක අවධාරණය කරලා කියනවා.ඒ වගේම අපි දුම්රියේ  යද්දි ,කඩවලට යද්දි අපට ඇහිලා තියෙනවා මිනිස්සු කියනවා අපේ පක්ෂේ සභාපතිතුමයි ජනාධිපතිතුමා කියලා.ඉතින් අපි සතුටු වෙනවා ඔබතුමාලා එහෙමවත් සතුටු වීම පිළිබඳව.අපි එතුමාට සුභාෂිංෂණ එක් කරනවා මේ දින 100 වැඩ සටහන ක්‍රියාත්මක කරලා අප්‍රේල්

මාසේ වෙනකොට මැතිවරණයකට යන්න ශක්තිමත් නිර් දේශපාලනයකට යන්න කවුරුත් කැමති විදියට පාලකයන් පත් කරගන්න හැකි වේවායි පතනවා.ඒ වගේම මේ යෝජනාව ගෙන ඒම සම්බන්ධයෙන් ජයන්ත මන්ත්‍රීතුමාටත් ස්තුතිවන්ත වෙනවා.

__ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්__

පක්ෂ ක්‍රමය නිසා වියවුල් වුනු රට නිරවුල් කිරීමේ අභියෝගය ජයගත් ,නව දේශපාලන සංස්කෘතියකට අඩිතාලම දැමූ අපේ වත්මන් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන ජනපතිදුන්ගේ වියජග්‍රහණය වෙනුවෙන් අපේ ශ්‍රී.ල.නි.පක්ෂයේ අපේ මේ මන්ත්‍රීවරු කිසිවෙකුද මම හිතන්නෑ විරුද්ධ වෙනවා කියලා.ඔවුන් සියලු දෙනාම එතුමාගේ වියජග්‍රහනයේ ප්‍රමෝදය භුක්ති විදිනවා කියලා මම හිතනවා.ඒ වගේම මෛත්‍රීපාල සිරිසේන මැතිදුන් පුලුල් ජීවිතාවබෝධයකින් යුක්ත වූ කෙනෙක්.එතුමා පක්ෂ ක්‍රමයේ ආදීනව පිළිබඳව කලක සිට සුවිශාල අධ්‍යනයක් කරලයි හිටියේ.අමාත්‍යවරයකු හැටියට,පක්ෂයක මහ ලේකම්වරයකු හැටියට එතුමා පුලුල් පරාසයක දැනුමකින් පරිපූර්ණ වෙලා හිටියේ.ඒ අනුව ඒ මහා අභියෝගය භාර අරගෙන ඒකට උර දුන්නේ.අපට අවාසනාවකට එතුමට සහය දෙන්න බැරි වුණා.නමුත් අපේ පක්ෂේ සභාපතිවරයා.එතුමා මේ මහා දැනුම නිසා ,පක්ෂ ක්‍රමයේ තියෙන ආදීනව දන්න නිසා අද ජාතික රජයකට අඩිතාලම තියලා තියෙනවා.මේ අවස්ථාවේ මාගේ පෞද්ගලික සුභාසිංශනය එතුමාගේ ඉදිරි වැඩ පිළිවෙලට යොමු කරමින් අම්බලන්ගොඩ ජනතාව වෙනුවෙන් එතුමාට සුභ පතමින් මම නිහඬවෙනවා.

- **ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී.ලක්ෂමී හේමන්තා සිල්වා මෙනවිය පෙ.ව.10.31 ට පමණ ගරු සභාවට පැමිණෙන ලදී.**

__ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමණි,ජේ.ඩබ්.ජයන්ත මැතිතුමා විසින් කරන ලද යෝජනාව ,අපි අම්බලන්ගොඩ නගර සභාවේ ආණ්ඩුපක්ෂයේ මන්ත්‍රීවරු විදියට මේ යෝජනාවට සුභාසිංෂන එකතුකරනවා.ඒ වගේම ශ්‍රී ලංකාව පුරාම යහපාලනයේ අරුණැල්ල විහිදී යාවිය කියලා මම හිතනවා.ඒ වගේම අපේ පක්ෂයේ ඉදලා අයින් වෙලා ගිහිල්ලා ජයග්‍රහණය කළ එතුමාට ඇත්තටම උදවු කලේ අපි නෙවෙයි.අපේ සහෝදර මන්ත්‍රීවරුන්.යුක්ති සහගත විපක්ෂයක් ලෙස එතුමන්ලා ලබපු ජයග්‍රහනයට කණ්ඩායමක් ලෙසත් ,පුද්ගලිකව මමත් ස්තුතිවන්ත වෙනවා.නමුත් එතුමන්ලාගේ හස්තයට හසු නොවෙච්ච.අපටත් ඒ තැන් මහ ඇරුණා.ඒ හැකියාව එතුමන්ලට ලැබෙයි කියලා මම විශ්වාස කරනවා.ජනාධිපතිවරණයට පෙර ජනවාරි 03 වැනිදා වගේ මට මතක ,මේ වගේ වේලාවක මම කීවා මට මතකයි ,මේ රැස්වීම පුලුවන්නම් අපි ජනවාරි 09 වෙනිදා තියමු කියලා.ඒ අවස්ථාවේ තිබුණේ අපි වෙනත් අපේක්ෂකයකු පරාජය කරනවා කියන අදහස නෙවෙයි අපි ජයග්‍රහණය කරනවා කියන අදහස.මගේ සහෝදර මන්ත්‍රීතුමා කියපු ආකාරයට පුංචි නිවරදි කිරීමක් කරන්න ඕන ගරු ජනිත් මන්ත්‍රීතුමණි,පක්ෂයේ සභාපතිත්වයක්වත් නොතිබුණු අවස්තාවක මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ප්‍රථමයෙන් ජයග්‍රහණය කළේ අපේ අසහාය නායකයා ලෙස අපි සලකන මහින්ද රාජපක්ෂ මැතිතුමා.එතුමා 2005 දී මැතිවරණයට මුහුණ දෙන අවස්ථාවේ පක්ෂ මූලස්ථානයේ හාෆ් ෂීට් කොළයක්වත් එතුමා වෙනුවෙන් වැය කරන්න අපට අවස්ථාවක් ලැබුණේ නෑ.අපේ හිටපු ජනාධිපතිතුමියගේ නායකත්වය තමයි එවකට තිබුණේ.එවැනි අවස්ථාවක තමයි ජන්දයක් දිනන්න අපි ප්‍රාදේශීය නායකත්වයක් ලබා දුන්නේ.අපේ වචනයෙන් ඇත්තමට කීවොත් පස්සෙන් ඉදන් පිහියෙන් ඇනීමක් ඒ අවස්ථාවේදී සිදු වුණා.පක්ෂනායකයින් කකුලෙන් අනිද්දී ගමේ ඉදපු අපි වගේ අය තමයි එතුමා වටේ ඒකරාශී වුනේ.ඒ වගේ හද ගැහෙන රිද්මයත් එක්ක සැබෑ ජනතා හිතවාදී පාලකයෙක් වුණ නිසා තමයි ඉතිහාසයේ පලවෙනි වතාවට ජනාධිපති කෙනෙක් පරාජය වුණාට පස්සේ එතුමාව බලන්න කරන්න,පූජනීය ස්ථානයකට වන්දනා මාන කරන්න යනවා වගේ එතුමා බලන්න යන්න අද ජනතාව පෙළ ගැසිලා ඉන්නේ.යම් යම් අඩුපාඩුකම් තියෙනවා.මම දකින විදියට එතුමාගේ මානුෂිකත්වය නිසා වැරදි කරපු අයට සුළුවෙන් හරි දඩුවම් දීම් සිද්ධ කළානම් එතුමාටත් මේ රටටත් මේ වටපිටාව උදාවෙන්නෑ.අපි වැරදි දකින්න ඕන.ස්වයන් විවේචනයක් තියෙන්න ඕන.අපි කරපු වැරදි පිළිගන්න,ජනතාව ඉදිරියේ ස්වයන් විවේචනයක් කරන්න අපට ශක්තියක් තියෙන්න ඕන.අපට ඒ හැකියාව තියෙනවා.මොකද අපි දැනුවත්ව මනුෂයකුට වැරැද්දක් කරන්නැති නිසා.ඒ වගේම කියන්න ඕන,ලෝක ඉතිහාසයේ ජනාධිපති කෙනෙක් පත් වුණ සැනෙන් තප්පර ගාණක් ඇතුලත අගමැති කෙනෙක් දිවුරුම් දීමත් ඉතිහාස ගත් දෙයක්.අපි කණගාටුවෙන් උනත් කියන්න දේවල් ටිකක් තියෙනවා,නව අය වැය සම්මත කරගන්න වෙන්නෑ විපක්ෂයේ උදවුවක් නොතිබුණා නම්.විසිතුන් වතාවක් පරාද වුණු විපක්ෂනායක කෙනෙක් වත්මන් ආණ්ඩුවේ අගමැතිධූරය දරනවා.ඒකත් ඉතිහාසගත වාර්තාවක් සභාපතිතුමණී.මෙහිදී ප්‍රදේශයේ පාක්ෂිකයන්ට සිදු වූ අකටයුතුකම් කිහිපයකුත් කියන්න ඕන.අපේ විපක්ෂ මන්ත්‍රීවරුන් කියන්න සතුටුයි මහත්මා දේශපාලනයක් කරන්නේ.නමුත් අපේ සහෝදර පලාත් පාලන ආයතන වල සහෝදර සභාපතිවරුන්ට උප සභාපතිවරුන්ට සිදු වන අකටයුතුකම් කිහිපයක් මෙහිදී සඳහන් කරන්න ඕන. මෙහිදී අම්බලන්ගොඩ නගර සභාව නියෝජනය කරන ආණ්ඩුපක්ෂයේ මන්ත්‍රීවරයෙක් විදියට මෙහිදී මම යෝජනාවක් කරනවා පාලින්ද නුවර ප්‍රාදේශීය සභාවේ ආරුමුගම් සභාපතිතුමාට සහ වත්තල ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමාට සිද්ද වෙච්ච

අකටයුත්ත සම්බන්ධයෙන්.ඊට අමතරව අම්බලන්ගොඩ දක්ෂිණ සංඝනායක ගරු සුදර්ම හිමියන්ට මුහුණපාන්න සිද්ධවෙච්ච ගැටලුව සම්බන්ධයෙනුත් අපේ කණගාටුව ප්‍රකාශකරනවා.එහිදී සමාජයේ අපට පාලනය කරන්න බැරි වුණ යම් යම් කොටස් පාලනය කරන්න ඔබලාට පුලුවන් වේවායි කියලා අපි විශ්වාස කරනවා.එහිදී අපි විශ්වාස කරනවා අතුරලියේ රතන හිමියන්ට, සෝභිත හාමුදුරුවන්ට ඒ අයිතිය තියෙනව නම් අම්බලන්ගොඩ සුදර්ම හාමුදුරුවන් ඇතුළු සංඝයා වහන්සේලාටත් මේ අයිතිය තියෙනවා කියලා.අපටත් යම් යම් අඩු පාඩු සිද්ධ වුණා පසුගිය කාලවලදී. වත්මන් රජයෙනුත් එය ඉටු වෙන එක සිහිනයක් වෙනවා මේ ආකාරයට ගියොත්.මොකද සභාපතිතුමණි පොලීසිය භාර ගරු අමාත්‍යතුමා තමයි මේ අවස්ථාවේ උසි ගැන්වීම කරන්නේ.මේක තමයි ආසන්නතම හේතුව විදියට අපි දකින්නේ.තමුන්නාන්සේලා රැකන් ඉදලා කරන්න පුලුවන් දෙයක් කරන්න කියලා තමයි ඒ කියන්නේ.මේ වගේ තත්වයක් තුළ දැලි පිහියෙන් කිරි කනවා වගේ වැඩක් තමයි මේ දේශපාලනයේ වචන හැසිරවීම.අපි ප්‍රකාශ කරන වචනයක් ඔස්සේ තමයි හෙට දවසේ අපි ප්‍රහාරයට ලක් වෙන්නේ.අද මේ කරන ප්‍රකාශයත් අපට යම් යම් ප්‍රශ්න වෙන්න පුලුවන් සභාපතිතුමණි.අපි විශ්වාස කරනවා උතුරු නැගෙනහිර ජන්ද වලින් නෙවෙයි එතුමන්ලා ජයග්‍රහණය කළේ. අපි පැහැදිලි පරාජයක් ලැබුවා.මේක අපේ පුද්ගලික ජයග්‍රහනයක් නෙවෙයි.රටේ සමස්ථ ජයග්‍රහණයක් හැටියට සලකලා අපි තීරණයක් ගත යුතු වේලාවක් විදියටයි සභාපතිතුමණි අපි දැක්කේ.අසියාවේ ආශ්චර්ය කරා ගිය ගමන තුල අපේ ගම් වල මිනිස්සුන්ට සුන්දර සිහිනයක් තිබුණා.ඒ සුන්දර සිහිනයන් ආපස්සට නොහරවා මෙතුමන්ලාගේ මේ යහ පාලන තත්වයන් ඉදිරියට ගෙනියන්න කියලා ආයාචනාත්මකව ඉල්ලනවා.දක්ෂිණ අධිවේගී මාර්ගයේ කටයුතු දැනටමත් නවතලා තියෙන්නේ.රටේ වාසනාවකට වරාය නගරය නැවත ඉදිකරන්න කියන ඉල්ලීම මෙතුමන්ලත් පිළිගෙන ඒක සිදුවෙනවා.එනිසා අපි දිගින් දිගටම ඉල්ලීමක් කරනවා රටේ සංවර්ධනය ආපස්සට හරවන්න එපා කියලා.ශ්‍රී.ල.නි.පක්ෂය ඇතුලු වත්මන් විපක්ෂයේ ආරක්ෂාව සම්බන්ධයෙන් තමුන්නාන්සේලාගේ අධීක්ෂණය හා අවධානය යොමු කරලා ඒ සම්බන්ධයෙන් සාධාරණයක් ඉෂ්ඨකරන්න ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරමින් තමුන්නාන්සේලාගේ ජයග්‍රහණය සැබෑ ජයග්‍රහනයක් ලෙස සලකමින් ඔබලාට සුභ අනාගතයක් පතමින් මම නිහඩ වෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී පුෂ්පික ඉන්ද්‍රජිත් මහතා කතා කරමින්**

අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සහ අග්‍රාමාත්‍යධූරයෙන් පිදුම් ලැබූ ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාට සහ නිවාස සහ සමෘද්ධි අමාත්‍ය ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාට සහ ගාල්ල දිස්ත්‍රික් අමාත්‍ය ගයන්ත කරුණාතිලක මැතිතුමාට මාගේ සුභාසංෂන එක් කර සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්**

විපක්ෂ නායක ජේ.ඩබ්.ජයන්ත මහතා ඉදිරිපත් කළ යෝජනාව මම හිතන්නේ ශ්‍රී ලංකාවේ 6 වන විධායක ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමාට ,ඒ වගේම අප පක්ෂයේ වත්මන් අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාට අමාත්‍ය මණ්ඩලයට සුභ ප්‍රාර්ථනා එක් කිරීම මං හිතන්නේ පක්ෂයක් වශයෙන් ,නගර සභාවක් වශයෙන් ,ප්‍රාදේශීය මන්ත්‍රීවරුන් වශයෙන් මම ඉතාමත්ම සතුටට පත්වෙනවා.ඉතාමත්ම තීරණාත්මක වූ මැතිවරණයකින් ගරු මෛත්‍රිපාල සිරිසේන මැතිතුමාට හැකියාව ලැබුණා මේ රටේ 06 වන විධායක ජනාධිපතිධූරයට පත්වෙන්න.මම සතුටට පත්වෙනවා තමන් විසින් තමන්ම පරාජය වූ බව පිළි අරගෙන වත්මන් ජනාධිපතිතුමාට සුභ පැතීම පිළිබඳව.ඒ සුභ පැතීම අවංකවම සිදු කළා කියලා මම විශ්වාස කරනවා.මොකද මම දැක්කා මීට සභා වාර 2 ට කළින් ඔබතුමන්ලා කොහොමද ඔබතුමන්ලාගේ පක්ෂයේ ලේකම්තුමාට ,අපේ පක්ෂයට ආපූ ජනාධිපති අපේක්ෂකයාට කතා කළේ කොහොමද කියලා.අද මේ යතාර්ථය පිළිගෙන රට පෙරට ගෙනයාමට පත් වූ නායකයාට සුභ පැතීම පිළිබඳ අපි ඇත්තටම සතුටට පත්වෙනවා.කිත්සිරි මන්ත්‍රීතුමා කීවා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට නැවත මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා පැමිණියා කියලා.මම විශ්වාස කරන්නෑ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා එළියට ආවා කියලා.එතුමා ශ්‍රී.ල.නි.පක්ෂයේ මහ ලේකම්වරයා වශයෙන්ම තමයි මැතිවරණයට ඉදිරිපත් වුණේ.එතුමා නැවත ශ්‍රී.ල.නි.පක්ෂයේ සමාජිකත්වය අරගෙන ගියා නෙවෙයි.එතුමා ශ්‍රී.ල.නි.පක්ෂයේ සභාපතීත්වය පූජා කෙරුවා.

**ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා කතා කරමින්**

සභාපතිතුමණි, එය මෙතුමන්ලගේ මැතිවරණ ප්‍රකාශන වල එහෙම තියෙනවා.ඒ වගේම එතුමා කියනවා තනතුරු සහ දේවල් සම්බන්ධයෙන් මම ලෝබීත්වයක සිටියනම් අද මට මේ දේ ලැබෙන්නෑ.ශ්‍රී.ල.නි.පක්ෂයේ සභාපතීත්වය කැප කරලා එළියට ආපූ නිසා තමයි කියලා මට අද ජනාධිපති වෙන්න ලැබුණේ කියලා එතුමා කියනවා.මාධ්‍ය ඉදිරියේ පත්තිරුප්පුවේදී තමයි එසේ කීවේ.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්**

එතුමා අද ශ්‍රී.ල.නි.පක්ෂයේ සභාපතීත්වය භාර අරගෙන රටට යහ පාලනය උදා කරන්න ,රටට ආදර්ශයක් දෙන්න ඉතිහාසයේ ප්‍රථම වතාවට පක්ෂ දේශපාලනයකින් තොරව සියලුම දේශපාලන පක්ෂ ඒකරාශී

කරගෙන රට ඉදිරියට ගෙන යන්න ,සංවර්ධනය කරන්න ,විශේෂයෙන්ම පසු ගිය කාල වල තිබුණු දූෂණය පිටු දකින්න එතුමා අද මූලිකත්වය ගෙන තියෙනවා.අපි දැක්කා පසු ගිය කාල වල කොහොමද මේ රටේ දූෂණය ඉහවහ ගිහින් තිබුණේ කියලා.රාජ්‍ය දේපල කොහොමද අයතා ලෙස යොදාගත්තේ කියලා.අපි දැක්කා රටේ දේශපාලනය කොහොමද පුද්ගලානුභූති වෙලා තිබුණේ කියලා.අපි දැක්කා පසු ගිය අයවැයේදී මිලියන 1000 ට එහා පැත්තේ තිබ්බ ජනාධිපතිවරයගේ වැය ශීර්ෂය මිලියන 250 ක් දක්වා අඩු කරලා කොහොමද රටට ආදර්ශයක් දුන්නේ කියලා.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒකට හිටපු ජනාධිපතිතුමා පිළිතුරු දීලා තියෙනවා,අද පත්තරේ.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේවි රොහාන් ද සිල්වා මහතා කතා කරමින්**

අපි දැක්කා මේ රටේ ඇමතිවරුන් රටේ සම්පත්,පොදු ජනතාවගේ සම්පත් කෙහොමද භාවිතා කළේ කියලා.අද ජනාධිපතිතුමා, අමාත්‍ය මණ්ඩලයේ නිළධාරීන් ආදර්ශයක් සපයලා තියෙනවා.මිලියන 458 ක් ජන්දවැඩ වලට භාවිතා කරපු හෙලිකොප්ටර් බිල් ගෙවන්න තියෙනවා ශ්‍රී ලංකා ගුවන් හමුදාවට.මේවයි නවතින්න ඕන.ඒකටයි යහ පාලනය ඕන.අපි දැක්කා පසු ගිය කාලේ කොහොමද සුඛෝපභෝගී වාහන,බස් භාවිතා කළේ කියලා.ඒක අතීතය.අපි ඒ අතීතය අමතක කරලා මේ ගමන යන්නේ.අපේ අනාගත සංස්කෘතිය විනාශ කරන්න කුඩු මේ රටට ගෙනාපු ,එතනෝල් මේ රටට ගෙනාපු ,මේ රටේ මහාපරිමාණ වශයෙන් දූෂණ කටයුතු කරපු අයට මෛත්‍රීපාලනයක් යටතේ අනිවාර්යයෙන්ම දඩුවම් ලබා දෙනවා.අද පොලීසිය,හමුදාව,මැතිවරණ කොමිසම,අධිකරණය මේ රජය යටතේ ස්වාධීන වෙයි කියලා මම විශ්වාස කරනවා.ඒ සඳහා තමයි අපි එ.ජා.පක්ෂය ප්‍රමුඛ හෙළ උරුමය එකතු වෙලා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ප්‍රමුඛ වෙලා මේ තත්වය උදා කරගන්න අපි සියලු දෙනා වෙහෙස ගත්තේ.ඔබතුමාලා නොදැක්කට මේ රටේ ජනතාව දැක්කා මේ රට යන විදිය වැරදී ,එනිසා වෙනසක් විය යුතුයි කියලා.ඒක තමයි ජනවාරි 8 වෙනිදා ක්‍රියාත්මක වුනේ.අපි අතින් වරදක් වුණානම් ඒක පිළිගන්නත් අපි කැමති.ඔබතුමා කීවා අති පූජ්‍ය සුදර්ම හිමියන්ට යම් කිසි සිත් තැවීමක් සිදු වෙලා තියෙනවනම් එ.ජා.පක්ෂ සාමාජිකයකු වශයෙන් ඒ සම්බන්ධයෙන් සමාව අයදිනවා මේ අවස්ථාවේ.නමුත් අපි දැක්කා පසු ගිය කාළේ කොහොමද මේ රටේ විවිධ අය ක්‍රියාත්මක වුනේ කියලා.මැතිවරණ කෙමසාරිස්තුමා නියෝග නිකුත් කරලා තියෙද්දි ඒ නියෝග පොලීසිය හරහා ආයතන වලට ලබා දීලා තියෙද්දි යම් යම් පුද්ගලයින් ක්‍රියාත්මක වුනේ කොහොමද කියලා අපි දැක්කා.මැතිවරණ සමයේ නොයෙක් වරදාන වරප්‍රසාද මිනිස්සුන්ට දීලා කොහොමද ඔවුන්ගේ මතය වෙනස් කරන්න උස්සාහ කළේ කියලා අපි දැක්කා. අපි ස්තූතිවන්ත වෙනවා ජනතාවට ඒවාට යටත් නොවීම පිළිබඳව.මෙතුමා කීවා දක්ෂිණ අධිවේගී මාර්ගය නවතා දමන්න කටයුතු කරනවා කියලා.අධිවේගී මාර්ග ඉතා හොඳයි.නමුත් මේ මාර්ග පද්ධතිය තුළ තිබුණ අති විශාල නාස්තිය වංචාව ඔබතුමාලා නොදකින්නේ මොන හේතුවක් උඩද කියලා මම අහනවා.අපි දැක්කා කි.මීටරයකට මිලියන 100 ක් යනවනම් ඒ සඳහා මිලියන 1000 ක ඇස්තමේන්තු හදලා තිබුණා.මාර්ග පද්ධතියට යටින් ගිය දූෂණය අපි දැක්කා.අන්න ඒ දූෂයයි නවතින්න ඕන.සියලුම අධිවේගී මාර්ග ඉදිකරනවා.ඒ ඉදිකරන්නේ ඒවාට යන වියදම් නියම ඇස්තමේන්තු සකස් කළාට පසුව.මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සහ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා විශ්වාස කරන්න.ඉවසන්න ,දින 100 වැඩ පිළිවෙළ සිදු වෙනවා.වැරදි නිවරදි කරන්න කාලයක් ගත වෙනවා.අපි සියලු දෙනාම පක්ෂ භේද නැතිව මේ රට ඉදිරියට ගෙනි යන්න අති ගරු ජනාධිපතිතුමාට ,රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමා ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලයට සහයෝගය ලබා දෙමු කියලා ඉල්ලීම කරමින් ජනාධිපතිතුමාට සහ අග්‍රාමාත්‍යතුමාට සුභාසිංෂණ එක්කරමින් මම නිහඩ වෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී.ලක්ෂ්මි හේමන්තා සිල්වා මෙනවිය කතා කරමින්**

ශ්‍රී ලංකාවේ හය වන විධායක ජනාධිපතිධූරයට පත් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට සහ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාටත් මාගේ සුභාසිංෂණ එක්කර සිටිනවා.මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති අපේක්ෂකයා විදියට පත් වුණාම අපේ පක්ෂයේ මහ ලේකම් විදියට හිටියේ නෑ.මොකද තිස්ස අත්තනායක මහත්මයා මහ ලේකම් විදියට ගන්නේ නෑ අපට මහ ලේකම් කෙනෙක් හිටියනම්.නමුත් අපේ ව්‍යවස්ථාවේ තියෙන නීති රීති වලට අදාලව මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා අපේ පක්ෂයේ සභාපතිවරයා ලෙස පත්වෙලා තියෙනවා.අපට සතුටුයි ,අම්බලන්ගොඩ ආසනය තුළ එ.ජා.පක්ෂකයන් අතරත් වාමාංශික දේශපාලනයේ නියුතු අපි අතරත් ගැටලු ඇති වෙලා නෑ.නමුත් සුදර්ම හාමුදුරුවන්ට වෙච්ච දේ ගැන කියන කොට කියන්න ඕන ඒ අවස්ථාවේ හිටපු කට්ටිය ගැන සුදර්ම හාමුදුරුවෝ පොලීසියට කියලා තියෙනවා.මම නැවත ඒ අයට ඇඟිල්ල දිග් කරලා කියන්න කැමති නෑ.නමුත් මෙහි බහුතරයක් ඉන්නේ එ.ජා.පාක්ෂිකයින්.රතින්ඤා වැලකුත් පන්සලේ එල්ලා.මම ඒක තරයේම හෙළා දකිනවා.ඒ හැර මැතිවරණයට පසු සමූපකාර මන්දිරයට කඩා වැදුණු පිරිසක් ජනාධිපතිතුමාගේ පින්තූරය ගලවලා දාලා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ඡායාරූපය එල්ලලා මහා කළබැගෑනියක් කරලා තිබ්බා.ඒවා හරිම අසෝභන වැඩ.ජනාධිපතිවරු 06 දෙනාගේම ෆෝටෝ ජනාධිපති මන්දිරයේත් තියෙනව නම් ,එතන විතරක් එහෙම කිරීම පිළිකුල් සහගතයි.මේ සම්බන්ධයෙන් පොලීසියට පැමිණිල්ලක් කළහම කිසිම විමර්ශනයක් කළේ නෑ.එනිසා සර්ව සුභවාදීව හැමදේම ඔබතුමාලගේ ආණ්ඩුවෙන් සිද්ධ වෙයි කියලා හිතන්න එපා.එහෙම වෙන්නෑ.නැවතත් ජනාධිපතිතුමාට සහ අග්‍රාමාත්‍යතුමාට

ස්තුතිවන්ත වෙමින් ඉදිරි මැතිවරණයේදී අතිගරු ජනාධිපතිතුමා අපේ සභාපතිවරයා ලෙස ශ්‍රී.ල.නි.කපක්ෂ ආණ්ඩුවක් පිහිටන්න මූලික වෙයි කියන විශ්වාසයත් ඇතිව මම නිහඩ වෙනවා.

- **ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා පෙ.ව.11.23 ට පමණ ගරු සභාවට පැමිණෙන ලදී.**

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

අපේ සුභාසිංෂන එකතුකරනවා අපි 06 වන විධායක ජනාදිපතිධුරයට පත් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට.ජනිත් මන්ත්‍රීතුමා චෝදනා කිහිපයක් එල්ල කළා.ඒවාට පිළිතුරු දිය යුතුයි.අපේ සභාවේ සේවකයෝ මෑතකදී පෝස්ටර් වගයක් ගහන්න ගියා කීවා.සේවකයන්ටත් අයිතියක් තියෙනවා දේශපාලනය කරන්න.සේවකයෙක් සේවය කරන වේලාවෙන් පස්සේ කරන කටයුතු සම්බන්ධයෙන් නීතිමය පියවර ගන්න සභාපතිවරයාටවත් ,ලේකම්වරයාටවත් බැහැ.රාත්‍රී කාලයේ සේවකයෙක් පෝස්ටරයක් අලවන්න යන එක සේවකයාගේ අයිතියක්.අපි ගියේ අපේ සභාපතිවරයෙක්ට සිදු වුණ අසෝභන සිද්ධියකට විරුද්ධව අපි පසු ගිය දිනක සීනිගම දේවාලයේ විරෝධතාවයක් තිබ්බා.ඒ පෝස්ටරය තමයි ඔය කියන්නේ මම හිතන්නේ.මම සතුටු වෙනවා යහපාලනය අම්බලන්ගොඩ නගරයේ යම් මට්ටමකින් හරි ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන්.ඒ සම්බන්දයෙන් අපේ මන්ත්‍රීවරුන් 4 දෙනාට මම ස්තුතිය ප්‍රකාශ කර සිටිනවා.මෙතනදී කියවුණා රනිල් වික්‍රමසිංහ මැතිතුමා 3 වන වරටත් අග්‍රාමාත්‍යධූරයට පත් වුණා කියලා.මෑතකදී පත්වෙද්දී ප්‍රජාතන්ත්‍රවාදය ,යහපාලනය මුලින්ම කඩා දැම්මා.බහුතරයක් නැති පක්ෂයකට අගමැතිධූරය පත් කිරීම තමයි යහපාලනය බිඳ දැම්ම තැන.අපි බලන් ඉන්නේ දින 100 දිහා.දැන් දින 30 ක් ගෙවිලා තියෙන්නේ.අපි සතුටු වෙනවා, හොරුන්ට දඩුවම් ලබා දෙන්න.ජනතා විමුක්ති පෙරමුණේ තමයි හිටපු හොඳම හොරු ටික හිටියේ.රජයේ දේපල විශාල වශයෙන් විනාශ කළ පිරිස ඉන්නේ ජනතා විමුක්ති පෙරමුණේ.අද සුදනෝ වගේ ගිහිල්ලා දෙනවා ෆයිල් පිටින් අල්ලස් දෙපාර්තමේන්තුවට.අගවිනිසුරු පත් කළා.හිටපු අගවිනිසුරුතුමා යැව්වේ කොහොමද.ඌවේ මහ ඇමතිතුමා.මේවද යහපාලනය.

**සභාවේ සෝෂාකාරී තත්වයක් ඇති විය.**

අපේ හිටපු ජනාධිපතිතුමා පසු ගිය දිනවල ප්‍රකාශයක් නිකුත් කළා තමන් මේ මේ චෝදනා වලට නිර්දෝශී කියලා.මේ වෙන මුකුත් නෙවෙයි සභාපතිතුමණි,ඉදිරියේ තියෙන මැතිවරණය පිළිබඳ මෙතුමන්ලගේ පොඩි භයක් තියෙනවා.ඒකයි මේ යහපාලනයක් කිය කිය කරන්නේ.රනිල් වික්‍රමසිංහ මහතා 3 න් පාරක් අගමැති වුණා කීවා.මං දන්න විදියට එක පාරක් ඩී.බී.විජේතුංග මහතා පත් වුණාට පස්සේ පත් වුණා.ඊට පස්සේ එතුමා ජයග්‍රහනය කරලා අගමැති වුණා.දැන් අගමැති වුණා පාර්ලිමේන්තුවේ බහුතර බලයක් නැතිව.ජන්දයෙන් එකපාරයි පත් වුණේ.ඒ වගේම සමූපකාරය ගැන විශේෂයෙන් කියන්න ඕන.ඒකේ තිබ්බ ෆෝටෝ එක බිම දාලා පොඩි කරලා දාලා තිබුණා.මම දන්නවා අපේ විපක්ෂේ මන්ත්‍රීවරු 4 දෙනා ඒක අනුමත කරන්නෑ.සුදර්ම හාමුදුරුවන්ගේ සිදුවීම ඉතාම කණගාටුදායකයි.අපේ සියලුම කටයුතු වලට එතුමා උපකාර කරනවා.ඒ පිළිබඳ අපගේ කණගාටුව මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.ඒ වගේම දැන් ප්‍රකාශ කළා රාජ්‍ය දේපල අයුතු විදියට අරගෙන තියෙනවා කියලා.මම කියන්නේ එහෙම අරගෙන තියෙනව නම් නැවත අරගන්න පුලුවන්නේ.මම හිතන්නෑ මේ සභාවේ කිසිම කෙනෙක් රාජ්‍ය දේපල ලබා ගෙන තියෙනවා කියලා.මෙතුමා කීවා ජනාධිපති මන්දිරයේ වියදම මිලියන 10,000 යි කියලා.මම ඊයේ දැක්කා අද ඉන්න ජනාධිපතිතුමාට කෝටි 273කියලා.හිටපු ජනාධිපතිතුමා ඊයේ මාධ්‍යයට කියලා තිබුණා කෝටි 900 ක් වෙන්කරලා තිබුණා.එත් ගියේ 275 ට තමයි ගියේ කියලා.මේ දින 100 යන්නේ ඉදිරි මැතිවරණයට යන ක්‍රියාවලියක් විදියට තමයි මම දකින්නේ.මෙතුමන්ලා කියනවා හොරකම ඉක්මණට ඉවර කරන්න බැරිලු.එහෙනම් මොකටද ප්‍රකාශ කරන්නෙ මාධ්‍යයෙන් හොරා හොරා කියලා.ඉතින් මේ යෝජනාව ගැන මම සතුටු වෙනවා.එතුමා අපේ සභාපතිවරයා.එනිසා අපේ කැබිනට්ටුවක් පිහිටුවන්න ලැබෙයි කියලා මම හිතනවා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

6 වන විධායක ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටත් අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාට සුභාසිංෂන එක් කිරීමට ගෙනාව යෝජනාවට කණ්ඩායමක් වශයෙන් අපේ සහය අපි එල කරනවා.රටේ පරිපාලනයේ යම් වෙනසක් ඇති කරන්න තමයි ජනතාව මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ජන්දය ලබා දුන්නේ.නමුත් එතුමාගේ රජයේ යම් යම් ස්ථාන පළුදු කරන මට්ටමට යම් යම් දේවල් රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමා ප්‍රමු ා අමාත්‍ය මණ්ඩලය සිදු කරමින් පවතිනවා.පළාත් පාලන සේවයේම පාලින්ද නුවර අපේ ප්‍රාදේශිය සභා මන්ත්‍රීතුමාට පාලිත තෙවරප්පෙරුම මන්ත්‍රීතුමා විසින් දණ ගස්සලා පහර දුන්නා.මේකද නව රජයේ යහ පාලනය කියලා අපි අහන්න ඕන.ඒ වගේම නීතිය හා සාමය පිළිබඳ ගරු අමාත්‍ය ජෝන් අමරතුංග මැතිතුමා වත්තල ප්‍රාදේශීය සභාවට ගිහිල්ලා තමන්ගේ පිරිස් මෙහෙය වුවා ඉන්න සභාපතිතුමා පුටුවෙන් ඇදලා දාන්න.එතුමා ඒක දන්නෑ කියලා කීවත් එතුමා මේ වගේ දෙයක් කරන්න යනවා කියලා පැහැදිලිවට ඊට පෙර දින පොලිසියට පැමිණිල්ලක් කරලා ආරක්ෂාව ඉල්ලලා තියෙනවා වත්තල ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා. පාර්ලිමේන්තුවේ විපක්ෂය භාර දීලා තියෙනවා විශ්වාස භංගයක්.නමුත් මගේ පුද්ගලික අදහස වෙන්නේ මේ යහ පාලනය පවත්වා ගෙන යන්න නම් මේ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යවරයාගේ

අමාත්‍යාංශය ජනාධිපතිවරයා යටතට වහාම පවරගන්න ඕන.මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාටත් වුනේ සමහර ඇමතිවරු කරපු වැරදි වලට දඬුවම් ලබා දුන්නේ නෑ.ඒකයි මිනිස්සු යහපාලනයක් වෙනුවෙන් වසර 9 ක් ගිය ආණ්ඩුව පෙරලුවේ.රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාගේ ආණ්ඩුව මං හිතන්නේ මාස 03 න් පෙරලේවී.මොකද යහපත් පාලනයක් අද වන විට ඇතිවෙලා නෑ.ඒ වගේම අම්බලන්ගොඩ නගර සභාවට එ.ජා.පක්ෂයේ ඉදපු මන්ත්‍රී කෙනෙක් ඇවිත් අපේ පියන් කෙනෙක්ට කියලා තියෙනවා හිටපු ජනාධිපතිතුමාගේ ෆොටෝ එක ගලවන්න කියලා.ඊට පස්සේ සමූපකාරයට ගිහිල්ලා හිටපු ජනාධිපතිතුමාගේ ෆොටෝ ගලවන්න කියලා තියෙනවා.පසු ගිය දවස් වල බස් නැවතුම්පළේ ,අපි ඡන්දේ ඉල්ලුවත් අපි බැනර් එකක් දැම්මේ නෑ.මහින්ද මහත්තයගේ ඡායාරූපයක් අපි දැම්මේ නෑ.මේ ඉන්න 4 දෙනාම ගිහිල්ලා කොඩි ටික දැම්මා.මං කතා කරලා කීවා දැන් තමුන්නාන්සේලාගේ රුස්වීම ඉවරයි මේ කොඩි ටික ගලවලා දාන්න කියලා.නැතිනම් මේ යහපාලනය නැති වෙනවා කියලා මම දේව් මන්ත්‍රීතුමාට පුද්ගලිකව කීවා.යහපාලනය මතක් වුනේ සති 2-3 ක් ගියාට පස්සේ.ඒක බලහත්කාර ක්‍රියාවක් ඇත්තටම.අපි 1998 බස් නැවතුම්පළ විවෘත කළ දවසේ ඉදලා බැනර් එකක් කොඩියක් නොදා ආරක්ෂා කළ එක යහපාලනය මතු වුනත් හරි විනාශ වෙලා ගියා.ඒ වගේම අපි තමුන්නාන්සේලා කරන පලාත් පාලන සේවය මේ මාර්තු 31 වෙනිදගෙන් අවසන් වෙනවා.එහෙම නම් කරන්න ඕන එකම දේ ඡන්දයක් කැදවන එක.නමුත් මැතිවරණය අකුලලා දාන්න මේ ආණ්ඩුව හදන්නේ.අද මැතිවරණය කල් දාලා,කොමසාරිස් පාලනයකට යන්න හදන්නේ ග්‍රාමීය ජනතාවගේ යහපාලනය බිද දමන්න මේ රජය කටයුතු කරනවා.ඒ වගේම සුදර්ම හාමුදුරුවෝ මේ ප්‍රදේශයේ තියෙන සෑම පොදු කටයුත්තකටම උදව් කරනවා.ස්වාමීන් වහන්සේ පුද්ගලිකව කාර් එකක් මිලදී ගත්තා.මේ කාර් එක ආන්ඩුවෙන් දීපු හොරකම් කරපු එකක් කියලා පොලීසියත් එක්ක ගිහිල්ලා විශාල සංදර්ශනයක් කරලා තිබුණා.අද ඇයි යහපාලනය සිදු කරන තමුන්නාන්සේලාට මේ අය පාලනය කරන්න බැරී.තමුන්නාන්සේලාගේ පාලනයෙන් තොරවද මේ පිරිස් ද ඉන්නේ.අපි ඔබලාගේ රුස්වීම් වලට ග්‍රවුන්ඩ් එක දුන්නා.අපට ඕන නම් බුක් කරලා තියන්න තිබුණා.ඒත් අපි එහෙම කළේ නෑ.එනිසා මතක තියාගන්න ඕන අපි ප්‍රජාතන්ත්‍රවාදයේ හැකි සෑම ස්ථානයක්ම ආරක්ෂා කරලා තියෙනවා.එනිසා අම්බලන්ගොඩ ප්‍රදේශයේ පොඩි පොඩි අයට කරන හිරි හැර වහාම නවත්තන්න කියලා අපි ඉල්ලනවා.එ.ජා.පක්ෂය විසින් ගෙන ගිය පහර දීපු ,ගෙවල් කඩපු දේශපාලන සංස්කෘතිය අවසන් කලා ශ්‍රී.ල.නි.පක්ෂ ආණ්ඩුව විසින් 1994 දී.මට මතකයි 1977 දී අපේ ගෙවල් වලට ගල් ගහන්න,කඩේට වැලි බෝතල් වලින් ගහන්න,කුඩු කරන්න ආපු මිනිස්සු.පෙළ පාලී වලින් ආවේ.එහෙම අතීතයක් තිබුණා.

- **ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.භාෂිනී මේනුකා විජේසූරිය මහත්මිය පෙ.ව.10.35 ට පමණ ගරු සභාවෙන් පිටව යන ලදී.**

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්**</u>

මගේ මාමා තරඟ කළේ එතකොට.පරණ සතොස ඉදිරිපිට කරුණාසේන මාමයි කියලා අපි කීවේ.අපේ යූ.ඇම්.පී.පක්ෂේ හොදම හිතවතා.ඡන්දෙට වැඩ කළා.පස්සේ මරලා දැම්මා.උසාවියේදී ඒකට දඬුවම් දුන්නා.ඒක තමයි මුල්ල මිනී මැරුම.ඊට පස්සේ අපේ කාලෙදී යම් යම් සිද්ධීන් වුණා.තමුන්නාන්සේ කීවට එදා 71 දී අපි පරාද වෙද්දි සරසවියට ගල් පාරවල් ගැහුවා,විනාශ කරලා දැම්මා.මේ වගේ සිද්ධි වුණා.ඊළඟට ගිය ජනාධිපතිවරණයේදී අපේ නෛයිදූවා වඩු සහෝදර මන්ත්‍රීවරයා පොලු වලින් ගහලා මරළා දැම්මේ අපි නෙවෙයි තමුන්නාන්සේලාගේ පක්ෂයෙන් තමයි.ඇත්තටම මම තමුන්නාන්සේලා කියනකම් දන්නෑ සුදර්ම හාමුදුරුවන්ගේ සිද්ධියක්.සමූපකාරේ පින්තූරයක් පොළවේ ගහලා කීවා.අපි කියන්න ඕන අපි මේ නගර සභාවට ආවා කවදාවත් කීවේ නෑ මේ පින්තූර ගලවන්න කියලා.ඒ මහත්තුරුත් රටට සේවයක් කළා.තමුන්නාන්සේ ඇවිල්ලා මුල්ම දවසේ ඩී.එස්.සේනානායක මහත්තයගේ පින්තූරය ගැලව්වා.මහින්ද මහත්තයා බැගෑපත්ව කීවා මේ පින්තූරය එල්ලන්න කියලා.

<u>**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ගලවලා දැම්මේ නෑ ,පින්තාරු කරන්නයි ඒක ගැලව්වේ.ඒක විතරක් නෙවෙයි ඔක්කොම ගලවලා තිබුණේ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්**</u>

අපි කියන්නෑ මේ පින්තූර ගලවන්න කියලා.ඒත් පින්තූරයක් ආවනම් ඒක එල්ලන්න ඕන.මෙතන රනිල් වික්‍රමසිංහ මහත්තයගේ පින්තූරයක් තිබුණා.ඔබතුමා ඒක ගැලවුවා.

<u>**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

රටේ නායකයන්ගේ ෆොටෝ විතරයි මෙතන ගහන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්**

ජී.එම්.එස් මහත්තයගේ පුද්ගලික සල්ලි වලින් මේ ෆොටෝ හැහුවේ.එතුමාට අපි සම්පූර්ණ ගෞරවය දෙන්න ඕන අමාත්‍යාංශයට කැමරාකරුවෙක් ගෙනිහිල්ලා මේ සේරම පින්තූර ගත්තේ එතුමා.එතුමාගේ වියදමින් මේවා ප්‍රේම් කළේ.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ පින්තූර වලට සියලූම දෙනාට සල්ලි ගෙවලා තියෙනවා.ගේන්න ඇති .නමුත් නගර සභාවෙන් සල්ලි දීලා තියෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්**

තමුන්නාන්සේ කීවා බස් ස්ටෑන්ඩ් එකේ අපි විතරයි කියලා කොඩි දාලා තිබුණේ.තමුන්නනේසේගේ ඇස් අන්ධ වෙන්න ඕන ,පසුගිය මැතිවරණයේදී ශ්‍රී.ල.නි.පක්ෂයේ නිල් කොඩි දාලා දිගටම, මාස ගණනක් තිබුණා,එතකොට සම්බු කියලා මන්ත්‍රී කෙනෙක් කොඩියක් දාලා තිබුණා බස් ස්ටෑන්ඩ් එක ඇතුලේ.අපිවත් ඇතුලේ දාලා නෑ.අපේ පින්තූරයක් අපි වැටෙන් එහා පැත්තේ ගැහුවේ නෑ.තමුන්නාන්සේට මතක නැතිව ඇති මහින්ද රාජපක්ෂ මහත්තයා දිනපු වෙලාවේ ඔරලෝසු කණුව ළඟ දිග සුභ පැතුම් පණිවිඩයක් දැම්මා.ඒවා අපට මතකයි.අපි ඒ වගේ දේවල් කරන්නෑ.අපි වැටෙන් මෙහා පැත්තේ තමයි මේ සේරම දේවල් කළේ.

**සභාවේ ඝෝෂාකාරී තත්වයක් ඇති විය.**

සුදම්ම හාමුදුරුවන්ගේ සිදුවීමත් මෙතනදී කියනකම් මම දන්නෑ.මහ පන්සලෙත් සිල් රෙදි බෙදුවා.පොලීසියෙන් ඇවිල්ලා කීවා බෙදන්න එපා කියලා.මමත් දන්නෑ පන්සලේ හිටියට මේකේ සිල් රෙදි තියෙනවා කියලා.හාමුදුරු කෙනෙක්ගේ කාමරේ තිබිලා තියෙන්නේ.ඉඳුනිල් මහත්තයා කියලා තියෙනවා අපේ ගෙදරට එන්න.අපි දෙන්නම් රෙදි කියලා.මම ඒ ආසන්නයේ හිටියේ.සුදර්ම හාමුදුරුවෝ වෑන් එකක රෙදි දාගන ආවා.වෑන් එකේ තියාගෙන තමයි රෙදි බෙදුවේ.මගේ ඇස් 2ට දැක්කා.ඒගොල්ලොත් දැක්කා මම ඉන්නවා.අපි දන්නවා හාමුදුරුවොත් දේශපාලනය කරනවා.ඒත් අපි ඒවට උරන වෙන්නෑ.මම කියන්නේ දැන් ජනාධිපති කෙනෙක් පත් වෙලා තියෙනවා,ලේකම් මහත්තයට හරි කියලා කොළඹ ගිහිපු වේලාවක හරි පින්තූරයක් ගෙන්නලා මෙතන ගහන්න කියලා.තමුන්නාන්සේලා කීවා වත්තල ප්‍රශ්නය.ඒක අපි අනුමත කරන්නෑ.ජෝන් අමරතුංග මහත්තයා එතන හිටියේ නෑ.අද ඒකට නීතිය ක්‍රියාත්මක කරනවා.ඒ වගේම තෙවරප්පෙරුම මහතමයගේ වැඩෙත් අපි කියන්නෑ හරිය කියලා.එයත් හොඳ කෙනෙක් නෙවෙයි.යූ.ඇම්.පී.කාරයින්ට වඳ දීපු කෙනෙක්.එතකොට අපි දන්නවා ෆොන්සේකා මහත්තයා ජන්දෙන් පැරදුනාහම එතුමට තාඩන පීඩන කරලා පැංෂන් එකත් නැති කළා.අපි එහෙම කළේ නෑ.හිටපු ජනාධිපතිතුමාට සියලු පහසුකම් සැලසුවා.අන්න ඒ දෙකේ වෙනස තියෙන්නේ. ඌව පළාතේ වෙච්ච දේගැන කීවා මන්ත්‍රීවරු එකතු වෙලා ඒ බලය දුන්නා කියලා. මම කියන්න ඕන ඌව පළාතේ වෙච්ච දේ ඊට කලින් දකුණු පළාතේ වුණා.

**සභාවේ ඝෝෂාකාරී තත්වයක් ඇති විය.**

දින 100 වැඩ පිළිවෙලේ තියෙනවා සංශෝධනයක්,මේ මන්ත්‍රීවරුන්ට පිල් මාරුකරන්න බෑ කියලා.ඒක ක්‍රියාත්මක කරන්න ඕන.මේක නිසා තමයි දේශපාලනය උඩු යටිකුරු වෙලා අද මේ තත්වය උදා වුණේ.තවත් අදහස් කීපයක් එතන තියෙනවා.පොලිස් බලතල,ස්වාධීන කොමිසමක්,මාධ්‍ය නිදහස,මැතිවරණ කොමසාරිස්ට තියෙන බලතල වගේ දේවල්.දැන් සුදානම් කරගෙන යනවා.දින 100 ඇතුලත ඒක අනුමත වේවී.ඒක යහපාලනයකට වැදගත්.තමුන්නාන්සේලා ජේ.වී.පී.එක ගැනකීවා.නමුත් මතක තියාගන්න හිටපු ජනාධිපතිතුමා කේ.පී ලා,පිල්ලෙයාන්ලා එක්ක වැඩ කළේ.ඔවුන් ඊට වඩා ශ්‍රී ලංකාවේ සම්පත් විනාශ කළ අය.දළදා මාළිගාව, ශ්‍රී මහා බෝධිය,අරන්තලාවේ හාමුදුරුවෝ ඝාතනය කළේ මේ අය.

**සභාවේ ඝෝෂාකාරී තත්වයක් ඇති විය.**

හකීම්ලා මේ පැත්තට ආවහම තමයි හොඳ නැත්තේ.ඔබතුමාලත් එක්ක වැඩ කරන කොට හොඳයි.සම්බන්ධන්ලා කට්ටිය යූ.ඇම්.පි.ආවම තමයි හොඳ නැත්තේ.

**සභාවේ ඝෝෂාකාරී තත්වයක් ඇති විය.**

මේ තත්වය තුළ රජයට වාසි අත් වෙලා තියෙනවා.ජී.එස්.පී.ප්ලස් ලැබිලා තියෙනවා.ඇගලුම් කර්මාන්තය දියුණු කරන්න පුලුවන් ඒකෙන්.මාළු සම්බන්ධ ගැටලුවක් තිබුණා.අද ඒක විසඳගන තියෙනවා.ආදායම් ලබා ගන්න පොදු රාජ්‍ය මණ්ඩලය සමඟ සාකච්ඡා කරලා දැන් ඒක කරගෙන යනවා.අධි වේගී මාර්ග ගැන කීවා.එදා රනිල් වික්‍රමසිංහ මහත්තයා තමයි කර්මාන්ත වලට ප්‍රවාහනය පහසු කර ගන්න අධි වේගී මාර්ග සාදන්න

කටයුතු කළේ.දකුණු පළාතේ හිස් ඉඩම් තියෙනවා ඇතුලට වෙන්න.ඒවායේ කර්මාන්ත ශාලා ආරම්භ කිරීමට ප්‍රවිෂ්ට මාර්ගයක් විදියට තමයි මේ අධිවේගී මාර්ග යෝජනා වුනේ.අපේ කාලෙදී මුල් ගල් තියලා ඉඩම් අත් පත් කර ගැනීම් කළාට ඊට වඩා කරන්න අපට බැරි වුණා.මිනිස්සු පාරවල් ගැනම හිතුවනම් මහින්ද මහත්තයට මීට වඩා ජන්ද ලැබෙනවා.මිනිස්සුන්ගේ මතය වුනේ මේ දේවල් වඩා,බඩගින්න ඊට වැඩියි කියන එක.තමුන්නාන්සේලා කොහොම කීවත් අපි එ.ජා.පක්ෂයෙන් මැතිවරණයට යනවා.අවුරුදු 2 ක් යන කොට යහපාලනය උදාවෙයි කියලා මම කියනවා.තමුන්නාන්සේ පළාත් පාලන මැතිවරණය ගැන කීවා.පසු ගිය කාලවලත් විසුරවලා මාස ගණන් ජන්දය නොතියපු කාලවල් තිබුණා.මම තමුන්නාන්සේට කියන්න ඕන,කරු ජයසූරිය මහත්තයා මට බොහොම හිතවත්.මම එතුමට ලිපියක් යොමු කළා ,උපකරණ දෙනවනම් අපට බැකෝ එකක් දෙන්න කියලා.එතුමා ඒක අනුමත කරලා දීලා තිබුණා.මම දන්නෑ මොනවද නගර සභාවට හම්බුනේ කියලා.නමුත් මම ඉල්ලුවා.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

නගර සභාවට වතුර බවුසරයකුත් ,කෘ කැබ් එකකුත් ලැබුණා.බැකෝ එක ලබා ගන්න ඔබතුමා සාකච්ඡා කරන්න.එතකොට ඊළඟ ලෝඩ් එකෙන් හරි ගන්න පුලුවන්.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්</u>

මම කොහොම හරි කතා කරලා බැකෝ එක අරගෙන දෙනවා.මොකද ඒක අපට අවශ්‍යයි.විවිධ අදහස් මතු වුණා.අපි යහපාලනයකට යන්න උත්සහ කරන්නේ.අපි නොදැණුවත්ව දේවල් වෙනවද කියන්න දන්නෑ.එහෙම දේවල් සිදු වෙලා තියෙනවනම් අපි ඒ ගැන කණගාටු වෙනවා.අදහස් දැක්වූ සියලු දෙනාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

- **ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී.ලක්ෂ්මි හේමන්තා සිල්වා මෙනවිය පෙ.ව.11.51 ට පමණ ගරු සභාවෙන් මදකට පිටව යන ලදී.**

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
මේ යෝජනාවට විරුද්ධ අය කවුරු හරි ඉන්නවද.

<u>තීරණය</u>

**ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මෙම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

- **ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා පෙ.ව.11.55 ට පමණ ගරු සභාවෙන් මදකට පිටව යන ලදී.**

## (6) කාරක සභා වාර්තා සලකා බැලීම

**6: 1** 2015.01.12 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂක වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා විසින් ස්ථිර කරන ලදී.

<u>පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව</u>
**<u>2015.01.12. ප.ව.2.30</u>**

<u>සහභාගීත්වය</u>

1. භාරත සමරසේකර — ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව

2. එම්.ඩී.මිත්‍රසිරි ද සිල්වා — පොලිස් පරීක්ෂක
3. පී.එස්.එස් ද සිල්වා මහතා. — මහජන සෞඛ්‍ය පරීක්ෂක
4. එච්.නයනා චාන්දනී — සංවර්ධන සම්බන්ධීකරණ
5. පී.සී.සජීවනි — තාක්ෂණ සේවා නිලධාරි
6. එම්.මලිත් ප්‍රනාන්දු මහතා. — තාක්ෂණ සේවා නිලධාරි
7. බී.ඩී.ඊ.කොඩිතුවක්කු — පවුල් සෞඛ්‍ය සේවිකා
8. ඩී.එස්.ඊ ගමගේ මිය — පවුල් සෞඛ්‍ය සේවිකා
9. පී.එච්.එල්.පුෂ්පරාණි — සංවර්ධන සහකාර
10. ආර්.සුසිලා නන්දනී ද සිල්වා — කළමණාකරණ සහකාර
11. එම්.එච් ආශා මිය — ග්‍රාම නිලධාරී 82, මහ අම්බලන්ගොඩ
12. ඕ.එස් දිශානි — ග්‍රාම නිලධාරී 86 බී කෙරමිණිය
13. පී.පී.රන්දික මදුෂාන් — ග්‍රාම නිලධාරී 85 බී පටබැඳිමුල්ල
14. එච්.කේ.ඩබ්.දේවප්‍රිය ගුණසේකර — ග්‍රාම නිලධාරී 85 ඒ හෙප්පුමුල්ල
15. පී.එච්.කුමාර ද සිල්වා — ග්‍රාම නිලධාරී 86 ඒ කළුවඩුමුල්ල
16. ඇම්.ඩබ් හිරාන් සංජීව — සෞඛ්‍ය පරිපාලක

**පිළිගැනීම.**

අම්බලන්ගොඩ නගර සභාවේ ලේකම්, භාරත සමරසේකර මහතා. සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව සඳහා පැමිණි සියළු නිලධාරී මහත්ම මහත්මීන් හා නගර සභා කාර්යමණ්ඩලය ඉතාමත් ගෞරවයෙන් පිළිගනු ලබන බව පවසන ලදි.

**2014.11.26 දින පැවති රැස්වීමේ සාකච්ඡා වු කරුණු සමාලෝචනය**

| මාතෘකාව | සාකච්ඡා වූ කරුණු | ප්‍රකාශය කවුරුන් විසින් ද යන වග. | තීරණය |
|---|---|---|---|
| කසල අවසන් බැහැරලන ස්ථානයට ප්‍රවේශ මාර්ගය සකස් කිරීම. | පිවිසුම් මාර්ගයේ 75%ක් පමණ සකස් කර ඇති අතර ඊට අදාළ බිල්පත් පියවා අවසන් කර නොමැති බැවින් මාර්ගයේ ඉතිරි කොටස අවසන් කිරීමට නොහැකි බව. | මහජන සෞඛ්‍ය පරීක්ෂක පී.එස්.එස් ද සිල්වා මහතා. | |
| පටබැඳිමුල්ල කොට්ඨාශයේ භාවිතයෙන් ඉවත් කරන ලද බෝට්ටු විනාශ කිරීම. | වෙරළ අයිනේ ඇති භාවිතයෙන් ඉවත් කරන ලද බෝට්ටු විනාශ කිරීම සඳහා බෝට්ටු අයිතිකරුවන් දැනුවත් කර ඇති බව. | මහජන සෞඛ්‍ය පරීක්ෂක පී.එස්.එස් ද සිල්වා මහතා. | |
| | බෝට්ටු විනාශ කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කර ඇති බව. | පොලිස් පරීක්ෂක එම්.ඩී.මිත්‍රසිරි ද සිල්වා | |
| පටබැඳිමුල්ල වරාය අසල පොදු වැසිකිළිය ආශ්‍රිතව කසල දැමීම | වරාය අසල පොදු වැසිකිළිය කඩා ඉවත්කිරීම සඳහා බැකෝ යන්ත්‍රයත්, එම ඉඩම් කොටසෙහි ආරක්ෂිත වැටක් ඉදිකිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ඇණවුම් කර ඇති බව. | තාක්ෂන සේවා නිලධාරී ජී.සී සජීවනී මිය. | |

| | | | |
|---|---|---|---|
| සෞඛ්‍ය පරිපාලක තනතරුවල පුරප්පාඩු | අවු 60 සම්පූර්ණ වීම නිසා සෞඛ්‍ය පරිපාලක ටී. බන්දුසීල මහතා 2015 පෙබරවාරි මාසයේ දීත් පත්මසේන මහතා සැප්තැම්බර් මාසයේදීත් විශ්‍රාම යාමට නියමිතව ඇති බැවින් ඉදිරියේ දී සෞඛ්‍ය අංශයේ දෛනික රාජකාරි ඉටු කිරීම ගැටළු සහගත තත්වයක් පවතින බව. | සෞඛ්‍ය පරිපාලක ඇම්.ඩබ් හිරාන් සංජීව මහතා | |
| | සෞඛ්‍ය පරිපාලක තනතුර සඳහා දෙදෙනෙකු පුහුණු කිරීමේ අවශ්‍යතාව පිලිබඳ සභාපතිතුමාගේ අවධානය යොමු කර | නගර සභාවේ ලේකම් භාරත සමරසේකර මහතා. | |
| කසල බැහැර කිරීම සඳහා දැනට පවතින ට්‍රැක්ටර් ප්‍රමාණවත් නොවන බව. | අළුතින් ට්‍රැක්ටර් දෙකක් මිල දී ගැනීම සඳහා සභාවේ අනුමැතිය ලැබී ඇති අතර ඒ සඳහා ටෙන්ඩර් කැඳවා ඇති බැවින් ඉදිරියේ මිලදී ගැනීම් සිදු කළ හැකි බව. | නගර සභාවේ ලේකම් භාරත සමරසේකර මහතා. | |
| ගාලු පාරේ ASB අසල මාර්ග සංවර්ධන අධිකාරිය සතු කාණු පද්ධතියේ ජලය රැඳී පැවතීම. | ගාලු පාරේ ASB අසල මාර්ග සංවර්ධන අධිකාරිය සතු කාණු පද්ධතියේ ජලය රැඳී පැවතීම. | පටබැඳිමුල්ල ග්‍රාම නිලධාරී පී.පී.රන්දික මදුෂාන් මහතා | |
| | මේ සම්බන්ධව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ දී සාකච්ඡා කළ බව. | මහජන සෞඛ්‍ය පරීක්ෂක පී.එස්.එස් ද සිල්වා මහතා. | |
| | මේ සම්බන්ධව මාර්ග සංවර්ධන අධිකාරිය වෙත සිහි කැඳවීම් ලිපියක් යවන ලෙස. | නගර සභාවේ ලේකම් භාරත සමරසේකර මහතා. | |
| ස්තුති කතාව | අද දින කමිටුව සඳහා සහභාගී වූ සියළුම ග්‍රාම නිලධාරී මහත්ම මහත්මීන්ටත්, නගර සභා කාර්ය මණ්ඩලයටත් ස්තුතිය පුද කරන බව. | කළමණාකරන සහකාර සුසිලා නන්දනී මිය | |
| නිමාව | ප.ව 4.30 ට | | |

සකස් කළේ -
පි.එච්.එල්.සී.පුෂ්පරාණි
සංවර්ධන සහකාර (පරිසර)

ලේකම්
භාරත සමරසේකර

**ඒ අනුව 2015.01.12 දින පවත්වන ලද පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂක වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**6: 2** 2015.01.22 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද සංවර්ධන උපදේශක කාරක සභා රැස්වීම් වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

අම්බලන්ගොඩ නගර සභාව

සංවර්ධන උපදේශක කාරක සභා රැස්වීම් වාර්තාව

දිනය - 2015.01.22 වේලාව - ප.ව.2.30

ස්ථානය - නගර සභා රැස්වීම් ශාලාව

පැමිණීම

1. ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා - සභාපති , නගර සභාව ,අම්බලන්ගොඩ.
2. ජී.ඩබ්. ගුණසිරි මහතා - සංවර්ධන උපදේශක කමිටු සාමාජික ප්‍රජා නියෝජිත
3. යූ.සමරසිංහ මහතා - සංවර්ධන උපදේශක කමිටු සාමාජික ප්‍රජා නියෝජිත
4. එම්.ජී.ආර්.පුෂ්පකුමාර මහතා - සංවර්ධන සහකාර, නගර සභාව , අම්බලන්ගොඩ.
5. අනිල් කෝලිත මහතා - සංවර්ධන උපදේශක කමිටු සාමාජික ප්‍රජා නියෝජිත
6. පී.ජී.ආරියරත්න මහතා - සංවර්ධන උපදේශක කමිටු සාමාජික ප්‍රජා නියෝජිත
7. ඩී.කේ.වරුසවිතාන මහතා - සංවර්ධන උපදේශක කමිටු සාමාජික ප්‍රජා නියෝජිත
8. ඩී.වාසනා තරංගී මිය - ප්‍රජා සංවර්ධන නිලධාරී , නගර සභාව, අම්බලන්ගොඩ.
9. එස්.ජී.සජීවනී මිය - තාක්ෂන නිලධාරී , නගර සභාව , අම්බලන්ගොඩ.
10. බර්ටි රණසූරිය මහතා - පෝරඹ, උපදේශක කමිටු සාමාජික ප්‍රජා නියෝජිත
11. එච්.මහින්දසේන මහතා - ඕකන්ද, උපදේශක කමිටු සාමාජික ප්‍රජා නියෝජිත
12. පී.එස්.එස්. ද සිල්වාමහතා - මහජන සෞඛ්‍ය පරීක්ෂක , නගර සභාව ,අම්බලන්ගොඩ

ගරු සභාපති නීතිඥ ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා විසින් පැමිණ සිටි සියළු දෙනා පිළිගනිමින් රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි. 2015 වර්ෂය සඳහා ප්‍රජා කමිටු රැස්වීම් පවත්වමින් ලබා ගත් යෝජනා අනුව සංවර්ධන කටයුතු සිදුකරමින් සිටින බව ප්‍රකාශ කරන ලදි.

කර්මාන්ත අංශය මගින් ඉටුකරන ලද කර්මාන්ත පිළිබඳව තාක්ෂන නිලධාරී සජීවනී මිය විසින් ප්‍රගතිය ඉදිරිපත් කරන ලදි. ඒ අනුව හිරිකැටිය පාර හා කාණුව කොන්ක්‍රීට් කරන ලද බවත්, තල්ගස්ගොඩ දළුක් කන්ද පාර ගල් අල්ලන ලද බවත්, ප්‍රයිම් ලැන්ඩ් ඉඩමේ තාර දැමීම සිදු කිරීමට විජ් ප්‍රමාදවීම නිසා පමා වූ බවත් ප්‍රකාශ කරන ලදි. සභාපති තුමා විසින් කියා සිටියේ ආදාහන මළුව පාරවල් සඳහා ඇස්තමේන්තුවක් සකස් කරන ලෙසය.

ක්‍රීඩා පිටිය සකස් කිරීමේ කටයුතු ප්‍රමාද වීමට හේතුව කොන්ත්‍රාත්කරුගේ වැඩ ප්‍රමාදවීම බව තාක්ෂණ සේවා නිලධාරී විසින් දන්වන ලදි.

කමිටු සාමාජිකයන් විසින් කරුණු පෙන්වාදෙමින් අයවැය සඳහා ප්‍රමුඛව සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදි.

සංවර්ධන කටයුතු කිරීමේ දී අධික්ෂණ කටයුතු සඳහා ජනතාව සම්බන්ධ කර ගැනීම පිළිබඳව සාකච්ඡා කරන ලදි. යූ.සමරසිංහ මහතා සඳහන් කළේ තාක්ෂණ නිලධාරීන් සමග එක්ව අධීක්ෂන කටයුතු සඳහා සහභාගීවීම සුදුසු බවය. එහි දී සභාපති නීතිඥ එම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා සඳහන් කළේ එය අනුමත කළ හැකි බවත් , ඊට අමතරව සියළුම කමිටු නියෝජිත ප්‍රජා නියෝජිතයන්ට කර්මාන්ත වල ඇස්තමේනතු පිටපතක් බැගින් ලබා දීමට කටයුතු කරන ලෙසය. ඒ අනුව කර්මාන්ත විෂය වෙත ලිපිනයන් ලබා දෙන ලෙසත් ඇස්මේන්තු පිටපත් සියළු

නියෝජිතයන් ට ලැබීමට සකස් වන පරිදි කටයුතු කිරීමට කර්මාන්ත විෂය වෙත දන්වන ලෙසත් තාක්ෂන නිලධාරී කියාසිටින ලද අතර කමිටුව එය නිර්දේශ කරන ලදි.
එසේම ක්ෂේත්‍රෙය් කටයුතු සඳහා ලොග් පොතක් අදාල වැඩබිමේ තබා ගැනීමටත් එහි කමිටු ප්‍රජා නියෝජිතයන් ට හා ඕනෑම පුරවැසියෙකුට පැමිණ අත්සන් තැබීමටත් හැකිවන පරිදි පවත්වාගෙන යාමටත් , ඒ බව අදාල කරමාන්තයේ ගිවිසුමට ඇතුලත් කිරීම සුදුසු බවටත් කමිටු ව නිර්දේශ කරන ලදි.

කමිටු නියෝජිත මහතුන් විසින් පෙන්වා දෙන ලදුව විස්කම් පෙදෙස පිට්ටනිය පවත්‍ර කර දෙන ලෙසත්, දේගොඩ පාරෙන් එන කාණුව වැලි පිරී ඇති බැවින් එය පවිත්‍ර කර දෙන ලෙසත් රාජ්‍ය සේවා පියස භාවිතයට ගන්නා ලෙස ප්‍රාෙද්ශිය ලේකම් වෙත දන්වා යවන ලෙසත් අදාල නිලධාරීන්ට සභාපති තුමා විසින් දන්වන ලදි.
කමිටුව විසින් පෙන්වා දෙනු ලැබුවේ මේ දිනවල ඩෙංගු පැතිරීම පිළිබඳව වැඩි අවධානයක් යොමු කළ යුතු බවත් අවධානම් සහිත ප්‍රදේශ  වල ඩෙංගු මර්ධන වැඩසටහන් ක්‍රියාත්මක් කිරීමට මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් වැඩි අවදානයක් යොමු කරන ලෙසත් ය.
තල්ගස්ගොඩ කමිටු නියෝජිත ආරියරත්න මහතා විසින් දන්වා සිටියේ කමිටුව විසින් අවදානය යොමුකළ අනතුරු දායක කොස් ගස ප්‍රාෙද්ශිය ලේකම් විසින් කපා ඉවත් කර ඇති බවය.
පලාදූව පාර වැඩ ආරම්භ කිරීමේ ගැටළුවට බර්ටි රණසූරිය මහතා මැදිහත් වන බවත් එබැවින් එම මාර්ගය සකස් කිරීමේ කටයුතු ආරම්භ කිරීමට කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදි.
ගල්රෝල කැඩී තිබුණ බවත් එය මේ වන විට අළුත් එන්ජිමක් සවි කර සකස් කර ඇති බවත් ඒ නිසා සිදු වූ ප්‍රමාදය ඉදිරියේ දී සිදු නොවන බවත් සභාපති තුමා විසින් පෙන්වා දෙන ලදි.
තනායමේ තත්ත්වය කෙසේදැයි බර්ටි රණසූරිය මහතා විසින් ප්‍රශ්ණ කරනු ලදුව මේවන විට තානායමේ කටයුතු සඳහා ඇස්කොට් ලෙෂර් ආයතනය සමග ගිවිසුම් ගතවී ඇති බවත්, මාස 12 බදු සහන කාලයක් ලබා දී ඇති බවත් ජනවාරි 20 වන විට පලමු වාරිකය ගෙවීමට නියමිත බවත් සභාපතිතුමා විසින් පෙන්වා දෙන ලදි.
තවදුරටත් අදහස් දක්වමින් සභාපති තුමා කියා සිටියේ ශ්‍රමය සැපයීමේ පදනම මත ද්‍රව්‍ය ලබා දීම පමණක් ඉටු කරමින් ශ්‍රම දායකත්වයෙන් සංවර්ධන කටයුතු ඉටුකිරීමට ඉදිරියේ දී කටයුතු කිරීම සුදුසු බවයි.
ප්‍රජා සංවර්ධන නිලධාරීවිසින් ස්තුති කථාව කරමින් පැමිණි සියළු දෙනාට ස්තුතිය ප්‍රකාශ කිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු අවසන් කරන ලදි.

සකස් කළේ : එම්.ජී.ආර්. පුෂ්පකුමාර
සංවර්ධන සහකාර

ලේකම්
අම්බලන්ගොඩ නගර සභාව

නීතිඥ ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප්
සභාපති
නගර සභාව අම්බලන්ගොඩ

**ඒ අනුව 2015.01.22 දින පවත්වන ලද සංවර්ධන උපදේශක කාරක සභා රැස්වීම් වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**6: 4** 2015.01.21 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද වෙළඳ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා විසින් ස්ථිර කරන ලදී.

අම්බලන්ගොඩ නගර සභාව

වෙළඳ සංගමය හා නගර සභාව ඒකාබද්ධව පවත්වන කමිටු රැස්වීම් වාර්තාව

දිනය - 2015.01.21 වේලාව - ප.ව.2.30

ස්ථානය - නගර සභා රැස්වීම් ශාලාව

පැමිණීම

13. ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා - සභාපති , නගර සභාව ,අම්බලන්ගොඩ.
14. භාරත සමරසේකර මහතා - ලේකම් , නගර සභාව , අම්බලන්ගොඩ.
15. ජේ.එච්.වජිර සිල්වා මහතා - වෙළඳ සංගමය, අම්බලන්ගොඩ
16. සමන් අත්තනායක මහතා - වෙළඳ සංගමය , අම්බලන්ගොඩ.
17. එම්.ජී.ආර්.පුෂ්පකුමාර මහතා - සංවර්ධන සහකාර, නගර සභාව , අම්බලන්ගොඩ.

කමිටු සාමාජික නගර සභා මන්ත්‍රී වරුන් පැමිණ නොමැති බැවින් අද දින කමිටුව නොපවත්වන ලදි.

සකස් කළේ : එම්.ජී.ආර්. පුෂ්පකුමාර

සංවර්ධන සහකාර

ලේකම්

අම්බලන්ගොඩ නගර සභාව

නීතිඥ ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප්

සභාපති

නගර සභාව අම්බලන්ගොඩ

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ කමිටුව සඳහා මන්ත්‍රීවරුන් පැමිණෙන්නෑ.මන්ත්‍රීවරුන් මේ කමිටුව අවශ්‍ය නෑ කියලා කියනවද?මොකද අපිත් වේලාව දාගන ,වැඩත් අතපසු කරගෙන මේවට සහභාගී වෙනවා.ඒත් අනෙක් අය එන්නෑ.එනිසා අවශ්‍ය නෑ කියනවනම් නවත්තන්න පුලුවන් කමිටුව.

**ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා කතා කරමින්**

මන්ත්‍රීවරුන්ට වඩා වෙළඳ සංගමයේ අය එන්නෑ නේද?

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒ අය එනවා.එහෙනම් මන්ත්‍රීවරු සක්‍රීයව මෙයට සහභාගී වන්න.

**ඒ අනුව 2015.01.21 දින පවත්වන ලද වෙළඳ කමිටු වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**6: 4** 2015.01.27 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**wïn,kaf.dv k.r iNdfõ .re iNdm;s;=ud uq,dikh ±rE 2015$01$27 Èk mqia;ld, lñgq jd¾;dj'**

- weï'ví,sõ' wreK m%§ma uy;d ^.re iNdm;s&
- ã'ù' jdikd ;rx.s ñh ^m%cd ixj¾Ok ks,Odßks&
- fla'ví' rxckS udfk,a fukúh ^mqia;ld,hdêm;sks&

- y¾nÜ ùrlafldä uy;d ^lñgq idudcsl&
- iq.;a fyÜáwdrÉÑ uy;d ^lñgq idudcsl&
- cS'ví' .=Kisß uy;d ^lñgq idudcsl&
- cS'tÉ't,a' mshka;s fukúh ^mqia;ld, idydhsld&
- taa'ví' bkaÞodi uy;d ^mqia;ld, idydhl&
- ta'cS' risld ñh ^mqia;ld, idydhsld&
- f.!ß j¾iú;dk ñh ^mqia;ld, idydhsld&

- ta'cS' ,laIañ fmf¾rd fukúh ^mqia;ld, idydhsld&
- tia' iqis,d oSmdks ñh ^mqia;ld, idydhsld&
- ud,;s iuka;d wdßhisxy ñh ^mqia;ld, idydhsld&

.re iNdm;s;=ud lñgqjg meñKs uy;au uy;aóka ms<s.ekSfuka miq lñgqfõ jevlghq;= wdrïN lf<ah'

- **,eî we;s ,sms bÈßm;a lsÍu'**
- .re iNdm;s;=ud úiska lñgq idudcsl isßmd, udÿqjf.a uy;d lñgqjg iyNd.s ùug fkdyels nj okajd tjk ,o ,smsh lñgqjg bÈßm;a lrk ,È'
- m%Odk mqia;ld,fha m%.;s jd¾;dj mqia;ld,hdêm;sksh úiska bÈßm;a lrk ,È' fmd,aj;a; iy ysf¾j;a; YdLdj, fiajh lrk iyhsldjka fofokd wikSm ù we;snj ta'ví' bkaÞodi uy;d m%ldY lrk ,È' tu YdLdj, jd¾;d Tyq úiska bÈßm;a lrk ,È' wfkl=;a YdLd mqia;ld,j, m%.;s jd¾;d ta ta YdLd Ndr ks,OdÍka úiska o" úoHq;a mqia;ld,fha jd¾;dj m%Odk mqia;ld,fha fiajh lrk mshka;s fukúh úiska o" bÈßm;a lrk ,È'
- mdGl woyia fmd;a mÍlaId lsÍfuka miq fymamquq,a, YdLdjg b,a,d we;s úÿ,s mxldj iqÿiq o hkak ;dlaIKsl ks<Odßka f.a ksÍlaIKh u; ,nd§u iqÿiq neõ .re iNdm;s;=ud mejiSh' túg f.!ß uy;añh th ,enqKq nj mejiqjdh'
- .re iNdm;s;=ud úiska fuu jir ;=, l%shd;aul lsÍug kshñ; jevigyka úia;rhla ,nk ui lñgqjg bÈßm;a lrk f,i mqia;ld,hdêm;sksh ±kqj;a lf<ah' iNdm;s;=ud ;jÿrg;a lshd isáfha ld¾h idOk ;r.j,§ ,l=Kq ,nd.; yels l%shdud¾.hka ie,ls,a,gf.k jevigyka l,hq;= nj;a h' tu fhdackdjg lñgq idudcsl iq.;a fyÜáwdrÉÑ uy;d .re iNdm;s;=udg ia;+;sh m%ldY lf<ah'

• k.r w,xldr .sKqfuka udislj remsh,a 50000$- l uqo,la fmd;a ñ,§ .ekSug ,ndÈh yels nj .re iNdm;s;=ud mejiSh' m<uqj m%Odk mqia;ld,hg remsh,a 50000$- l fmd;a yd ixhqla; ;eá o ms<sfj,ska idudcsl ixLHdj jeä YdLd mqia;ld, j,g iEu uilu remsh,a 50000$- l fmd;a ñ,§ .ekSug yels nj .re iNdm;s;=ud mejiSh' YdLdNdr ks,OÍkag fmd;a ñ,§ .ekSug hEu i|yd iNdfjka jdykhla ,ndÈh yels nj .re iNdm;s;=ud mejiSh' YdLd mqia;ld, j,g <uqka fmd;am;a mßYS,kh i|yd meñfkKjd±hs ;jÿrg;a lreKq úuiqy'<uqkag w¨;a fohla ksßudKh l<hq;= nj .re iNdm;s;=ud mejiqfõh' m%Odk mqia;ld,fha úu¾Ykh yd iaj wOHkh lsÍug meñfKk mdGlhka ixLHdj m%ia:drhla u.ska fmkakqï lrk f,i mqia;ld,hdêm;sksh ±kqj;a lf<ah'

• m%Odk mqia;ld,fha fiajh lrk mshka;s fukúh lshd isáfha úu¾Yk wxYhg meñfKk <uqkag Èjd wdydrh ,nd .ekSug iqÿiq ia:dkhla fkdue;s njhs' fuh w;HjYH lreKla neúka thg iqÿiq mshjrla ,nd §ug lghq;= lrk f,i lñgq idudcsl uy;=ka mejiSh'

• ´lkao yd uywïn,kaf.dv YdLd mqia;ld,j,g fmd;am;a ;nd .ekSug lnâ wvqnj tu ks,Odßka mejiqy' .re iNdm;s;=ud lshdisáfha m%ñ;shg wkqj mqia;ld, fiajd uKav,fhka yd oïfrda wdh;kfhka fidhdn,d th ksrdlrkh lrk f,i m%cd ixj¾Ok ks,Odß;=ñh ±kqj;a l<dh'

• mqia;ld,hdêm;sksh úiska wishd mokï wdh;kfhka fmd;a mß;Hd.hla ,ndfok nj ÿrl:k weu;=ulska ±kqï ÿka nj;a i|yka l<dh' tu fmd;a ,nd .ekSug lghq;= lrk f,i .re iNdm;s;=ud mqia;ld,hdêm;skshg lshd isáhdh'

• mqia;ld, j,g fmd;a ñ,§ .ekSfï§ fmd;a idmamq j,ska fmd;a kdudj,s ,ndf.k wjYH fmd;a f;drd.ekSug lghq;= lrk f,i .Kldêldß uy;d Wmfoia fok ,È' fmd;a f.k tAug hEfñ§ lñgq idudcsl uyf;l=o iyNd.s lrjd .;hq;= nj .re iNdm;s;=ud mejiSh'

• lñgqfõ jevlghq;= wjika lsÍug m<uqj ia;=;s l;dj lsÍu ioyd .re iNdm;s;=ud úiska m%cd ixj¾Ok ks,Odß;=ñhg wdrdOkd l<dh' tysÈ t;=ñh iafõÉPdfjka lñgqjg meñKs ish¨u uy;au uy;aókag ia;=;sh m%ldY lrñka lñgqfõ jev wjika lf<ah'

''''''''''''''''''''''''''''''''''''''''''

lñgq f,alï"

k.r iNdj wïn,kaf.dv'

''''''''''''''''''''''''''''''''''''''''''

''''''''''''''''''''''''''''''''''''''''''''''''

f,alï"                                         w;aika lf<a iNdm;s"

k.r iNdj wïn,kaf.dv'                          k.r iNdj wïn,kaf.dv'

**ඒ අනුව 2015.01.27 වන දින පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

**6: 5** 2015.01.22 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

<u>ක්‍රීඩා කමිටු වාර්තාව - අම්බලන්ගොඩ නගර සභාව</u>

දිනය - 2015.01.22

වේලාව - ප.ව. 3.30

ස්ථානය - නගර සභා රැස්වීම් ශාලාව

<u>සහභාගීත්වය</u>

| | | |
|---|---|---|
| 01. අරුණ ප්‍රදීප් මනිමෙල් වඩු මහතා | - | ගරු සභාපති, අම්බලන්ගොඩ නගර සභාව. |
| 02. කේ.ජේ.තාබ්‍රේව් මහතා | - | රියෝ ක්‍රීඩා සමාජය |
| 03. කසුන් ගාල්ලගේ මහතා | - | ක්‍රීඩා නිලධාරී |
| 04. දසන් නයිදුවාවඩු මහතා | - | සිංහ ක්‍රීඩා සමාජය |
| 05. සරත් ශාන්ත මහතා | - | ක්‍රීඩා කමිටු සාමාජික |
| 06. මහේන්ද්‍ර වික්‍රමසිංහ මහතා | - | ක්‍රීඩා කමිටු සාමාජික |
| 07. ඩබ්ලිව්.ඒ.ඒ.ගුරුසිංහ මහතා | - | ක්‍රීඩා ආචාර්ය, ගා/ධර්මාශෝක විද්‍යාලය |
| 08. ජී.අශෝක කුමාර මහතා | - | ක්‍රීඩා භූමි උපදේශක |
| 09. ඉඳුනිල් එදිරිවික්‍රමසූරිය මහතා | - | පාපන්දු පුහුණුකරු |
| 10. ඩී.වී.තරංගි | - | ප්‍රජා සංවර්ධන නිලධාරී |

**පිළිගැනීම - අරුණ ප්‍රදීප් මනිමෙල් වඩු මහතා,ගරු සභාපති**

ක්‍රීඩා කමිටුව සඳහා පැමිණි සියළු මහත්ම මහත්මීන් පිළිගනිමින් ක්‍රීඩා කමිටුවේ කටයුතු ආරම්භ කරන ලදී.

**ක්‍රීඩා කමිටුව වෙත ලැබී ඇති ලිපි ඉදිරිපත් කිරීම -**

ගා/ශ්‍රී දේවානන්ද විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පති ජයසේන එගොඩගේ මහතා විසින් පාසල් ආදිශිෂ්‍යාවකගේ අවමංගල්‍ය උත්සවයකට සහභාගී වීමට කොළඹ යාමට ඇති බැවින් ක්‍රීඩා කමිටුවට සහභාගී වීමට නොහැකි බව හා ක්‍රීඩා කමිටුවට ලිපි තුනක් ඉදිරිපත් කරන බව මේ පිළිබඳව අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

1. **<u>මහජන ක්‍රීඩාපිටියේ ධාවන පථ ඉසව් පැවැත්වීමේ සීමා පථ ඇඳීමේ කාර්ය ඉටු කරවා ගැනීම පිණිසයි</u>**

උක්ත කරුණට අදාළව ඉදිරිපත් කරන ලද ලිපිය සාකච්ඡාවට ගත් අතර නගර සභාව මඟින් මිනින්දෝරු මහතෙකුගේද සේවය ලබා ගනිමින් මුදල් වියදම් කර ධාවන පථ මැන සලකුණු කර ඇති බැවින් පථ ඇඳීම පාසල් මඟින් සිදු කර ගන්නා ලෙසට තීරණය කරන ලදී.

2. **<u>විශේෂ අවශ්‍යතා ඇති දරුවන් වෙනුවෙන් ක්‍රීඩා පුහුණු කඳවුරක් පැවැත්වීම.</u>**

මෙම ලිපිය මඟින් 2015.01.24 දින පෙ.ව.9.00 සිට 10.30 දක්වා මළල ක්‍රීඩා පුහුණුව සඳහා නගර සභා ක්‍රීඩා පිටිය ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.මෙදින ක්‍රීඩාංගණය ක්‍රිකට් තරඟයක් සඳහා සිංහම ක්‍රීඩා සමාජය විසින් වෙන්කර ගෙන සිටින බැවින් එම ක්‍රීඩා සමාජයේන් විමසා පෙ.ව 9.00 සිට 10.00 දක්වා ක්‍රීඩා පිටිය ලබා දීමට තීරණය කරන ලදී.

3. **<u>කුලරත්න පාරේ, බැඩ්මින්ටන් ක්‍රීඩාගාරය වටා ඇති වහල් පියසිවල උළු මාරු කිරීම් හා සුළු අළුත්වැඩියා කටයුතු</u>**

මෙම කාර්යය නගර සභාව මඟින් ඉටු කිරීමට තීරණය කරන ලදී.

**ඩබ්ලිව්.ඒ.ඒ.ගුරුසිංහ මහතා, ක්‍රීඩා ආචාර්ය,ගා/ධර්මාශෝක විද්‍යාලය**

2015 වර්ෂය සඳහා ක්‍රීඩා පිටිය වෙන්කිරීමේ සාකච්ඡාව සඳහා කැඳවීමේ ලිපිය ධර්මාශෝක විද්‍යාලයට නොලැබුණු බැවින් එදින සාකච්ඡාවට සහභාගී නොවූ අතර මේ නිසා ජනවාරි මාසයේ එක් දිනයක්වත් ධර්මාශෝක විද්‍යාලයට නොලැබුණු බව හා පෙබරවාරි මාසයේ දින දෙකක් පමණක් ලැබුණු බව මේ නිසා නිවාසාන්තර ක්‍රීඩා උළෙල මාර්තු මාසයේදී පැවැත්වීමට සිදුවන බව දන්වන ලදී.ක්‍රීඩා පිටිය වෙන් කිරීමේදී ආචාර්යවරු අනෙක් පාසල් ගැන ද සැලකිලිමත් වීම වැදගත් බව පෙන්වා දෙන ලදී.

**ජී.අශෝක කුමාර මහතා, ක්‍රීඩා භූමි උපදේශක**

අදාළ ලිපි සියළුම පාසල් වලට යවන ලද බව දන්වා සිටින ලදී.

**ඩබ්ලිව්.ඒ.ඒ.ගුරුසිංහ මහතා,ක්‍රීඩා ආචාර්ය,ගා/ධර්මාශෝක විද්‍යාලය**

දේවානන්ද විද්‍යාලයේ ගොඩනැගිලි ද්‍රව්‍ය ඉවත් කිරීමට යන වාහනවලින් දුර පැනීමේ ක්‍රීඩා පිටියට හානි සිදුවී ඇති බැවින් යළි සකස් කර දෙන ලෙස ඉල්ලා සිටිමි.

**අරුණ ප්‍රදීප් මනිමෙල්වඩු මහතා, ගරු සභාපති**

දේවානන්ද විද්‍යාලයේ දෙමහල් ගොඩනැගිල්ල ඉවත් කිරීම සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමට පිට්ටනියෙන් ඇතුල් වීමට අවසර දෙනු ලැබුවේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂිකාවගේ ඉල්ලීම මත බවත්, හානි වී ඇති දුර පැනීමේ පිටිය යළි පිළිසකර කර ඒ සඳහා වැය වූ මුදල අදාළ තැන්පත් මුදලින් අඩු කර ගැනීමට පියවර ගන්නා ලෙසට දන්වන ලදී.එමෙන්ම එම ගේට්ටුව අළුතින් ඉබ්බකු දමා යතුර ආරක්ෂක අංශයේ තබා ගන්නා ලෙසටක්, එම වාහන එන අවස්ථාවේ දී ආරක්ෂක අංශය විසින් ගේට්ටුව අරින ලෙසටත්,එම ඉබි යතුරු සඳහා වන වියදමද තැන්පත් මුදලෙන් ලබා ගන්නා ලෙසටත් උපදෙස් ලබා දෙන ලදී.

**ඩබ්ලිව්.ඒ.ඒ.ගුරුසිංහ මහතා, ක්‍රීඩා ආචාර්ය, ගා/ධර්මාශෝක විද්‍යාලය**

ඉදිරි සතිය තුළ පාසල් නිවාසාන්තර මළල ක්‍රීඩා මූලික හා අවසන් තරඟ පැවැත්වීමට නියමිත බැවින් ඊට පෙර ධාවන පථ වල ඇති වළවල් වසා ක්‍රීඩාංගණය සකස් කර දෙන ලෙස ඉල්ලා සිටිමි.

**කසුන් ගාල්ලගේ මහතා, ක්‍රීඩා නිලධාරී**

මළල ක්‍රීඩා මූලික තරඟ පොල්වත්ත ක්‍රීඩාංගණයේදී පැවැත්වීමට ක්‍රීඩාංගණය සකස් කර දෙ ලෙසට කමිටු ගණනාවක දී යෝජනා කළද මේ දක්වා එය ඉටු නොවූ බව.

**ජී.අශෝක කුමාර මහතා, ක්‍රීඩා භූමි උපදේශක**

ඒ සඳහා J.C.B යන්ත්‍රයක් හා පස් අවශ්‍ය බව සැලසුම් නිලධාරිට ලිඛිතව දන්වා ඇති බව හා මේ දක්වා ලබා නොදුන් බව.

**අරුණ ප්‍රදීප් මනිමෙල් වඩු මහතා, ගරු සභාපති**

මෙම සියළුම කරුණු සලකා බලා ක්‍රීඩාංගණ වල ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනමින් සිදුකළ යුතු බැවින් ප්‍රජා සංවර්ධන නිලධාරී වෙත නගර අලංකරණ ගිණුමෙන් රු.20,000.00ක අත්තිකාරම් මුදලක් ලබා දීමට තීරණය කිරීම.

**ජී.අශෝක කුමාර මහතා,ක්‍රීඩා භූමි උපදේශක**

තණකොළ කපන යන්ත්‍රය පාසල් හා අනෙකුත් රාජ්‍ය ආයතනවලටද නොමිලේ ලබා දෙන අතර එම බොහොමයක් භූමි සමතලා නොමැති බැවින් තල ඉක්මනින් කැඩෙන බව හා එම තල කොළඹින්ම මිළදී ගැනීමට සිදු වන බව. මේ නිසා එම ආයතන වලට Brush Cutter එක යැවීම සුදුසු බව.

**අරුණ ප්රදීප් මනිමෙල් වඩු මහතා, ගරු සභාපති**

එම ඉල්ලීම් කරනු ලබන්නේ බොහෝ විට පාසල් වල විදුහල්පතිවරු හා රාජ්‍ය ආයතන වල ප්‍රධානීන් නිසා අදාල ඉල්ලීම් ප්‍රතික්ෂේප කළ නොහැකි බව හා අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ සුහදව කටයුතු කිරීම වැදගත් බව පෙන්වා දීම.

**සරත් ශාන්ත මහතා**

ක්‍රීඩාංගණය වෙන්කර ගැනීමේ දී පාසල්, පාසල් අතරත් ක්‍රීඩා සමාජ, ක්‍රීඩා සමාජ අතරත් සුහද මාරුවීම් සිදු කළද ක්‍රීඩා සමාජ සහ පාසල් අතර සුහද මාරු සිදු කල නොහැකි බව දන්වා සිටිමි.

**අරුණ ප්‍රදීප් මනිමෙල් වඩු මහතා, ගරු සභාපති**

ක්‍රීඩා සමාජ සහ පාසල් අතරද ඉතිරි මුදල අයකර අදාළ සුහද මාරුකිරීම් සිදුකළ හැකි බවට තීරණය කරන ලදී.

**ස්තුති කථාව -** ඩී.වී.වාසනා තරංගි, ප්‍රජා සංවර්ධන නිලධාරී

අද දින තම වටිනා කාලය වැය කරමින් ක්‍රීඩාවේ උන්නතිය උදෙසා අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීමට පැමිණීම සම්බන්ධයෙන් ස්තුතිය පළකරමින් කමිටුවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.

**සකස් කළේ :-**

ඩී.වී.තරංගි,

ප්‍රජා සංවර්ධන නිලධාරි.

ලේකම්,
අම්බලන්ගොඩ නගර සභාව.

**ඒ අනුව 2015.01.22 දින පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

## (07) ටෙන්ඩර් හා මිළ ගණන්

**7 ටෙන්ඩර් හා මිළ ගණන් (-**

7:1 ටෙන්ඩර් (- නැත

**7:2 මිළ ගණන් (-**

**7:2:1** ගබඩා භාණ්ඩ සඳහා මිළ ගණන් කැඳවන ලද අතර ගණකාධිකාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිළ ගණන් අතරින් අවම මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | පූර්ණ වෙළඳසැල | නයන රංජන සේල් පොළ | බී.කේ.එස්.පුද්ගලික සමාගම |
|---|---|---|---|---|---|
| 01 | අත් ආවරණ | 40 | 65.00 | 75.00 | 150.00 |
| 02 | ප්ලාස්ටික් තාච්චි | 10 | 115.00 | 100.00 | 125.00 |

**7:2:2 49-9422** ට්‍රැක්ටරයේ ඉදිරිපස අලුත්වැඩියා උපාංග මිලදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර තාක්ෂණ සේවා නිළධාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිළ ගණන් අතරින් අවම මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | රත්න මෝටස් | සෙනෙවිරත්න පුද්.සමාගම | ප්‍රියන්ත මෝටර්ස් |
|---|---|---|---|---|---|
| 01 | Front Axel | 02 | 9900.00 | 10500.00 | 11000.00 |
| 02 | King Pin Brush | 04 | - | - | - |
| 03 | T- 126 | 02 | - | - | - |
| 04 | Arm Housing | 02 | 21000.00 | 22000.00 | 25000.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 05 | Front Tie Rod | 02 | 3750.00 | 4000.00 | 4500.00 |
| 06 | Hitch Half Set | 01 | 26500.00 | 27250.00 | 28500.00 |

**7:2:3** පැස්සුම් අංශය සඳහා සපත්තු මිලදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර තාක්ෂණ සේවා නිළධාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිළ ගණන් අතරින් අවම මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | හරම් පැලස් | ඩී.එස්.අයි.ෂෝ රූම් | ඩී.සැම්සන් සහ පුත්‍ර සමාගම |
|---|---|---|---|---|---|
| 01 | සපත්තු | 02 | 2200.00 | 1169.90 | 2249.90 |
| 02 | මේස් | 02 | 250.00 | 210.00 | 210.00 |

**7:2:4** **කි.ලෝ.** 37.5 ගෑස් සිලින්ඩර් මිලදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර තාක්ෂණ සේවා නිළධාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිළ ගණන් අතරින් අවම මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | මිළිඳු එන්ටර් ප්‍රයිසස් | බින්දු හේවා සේල්ස් අවුට්ලට් | එම්.ජී.ද සිල්වා සේල්ස් අවුට්ලට් |
|---|---|---|---|---|---|
| 01 | **කි.ලෝ.** 37.5 ගෑස් | 01 | 5320.00 | 5340.00 | 5310.00 |

**7:2:5** නව ට්‍රේලරයක් සෑදීම සඳහා බඩු මිලදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර තාක්ෂණ සේවා නිළධාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිළ ගණන් අතරින් අවම මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | රත්න මෝටස් | සෙනෙවිරත්න පුද්.සමාගම | ප්‍රියන්ත මෝටර්ස් |
|---|---|---|---|---|---|
| 01 | Trailer Axel | 01 | 26500.00 | 27200.00 | 28200.00 |
| 02 | Hydrolic Jack | 01 | 24500.00 | 25500.00 | 26100.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 03 | Hose Trailer | 01 | 3950.00 | 4200.00 | 5000.00 |
| 04 | Trailer Hitds | 01 | 3750.00 | 4000.00 | 4500.00 |

**7:2:6** **ගබඩාවට ටේප් මිලදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර තාක්ෂණ සේවා නිළධාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිළ ගණන් අතරින් අවම මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | පූර්ණ වෙළඳසැල | බී.කේ.එස්.කම්පැණි පුද්ගලික සමාගම | ඉඳුනිල් හාඩ්වෙයාර් |
|---|---|---|---|---|---|
| 01 | අඩි 100 ටේප් | 04 | 750.00 | 700.00 | මිළ ගණන් ඉදිරිපත් කර නොමැත |

**7:2:7** PF **7424 ඩබල් කැබ් රථයේ පිටුපස ආවරණ සෑදීම සඳහා ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර තාක්ෂණ සේවා නිළධාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිළ ගණන් අතරින් අවම මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | එල්කාඩෝ ට්‍රේඩින් ප්‍රයිවට් ලිමිටඩ් | යූ.එන්.අයි මොටෝ ප්‍රයිවට් ලිමිටඩ් | මාතර වෙල්ඩින් වර්ක්ස් |
|---|---|---|---|---|---|
| 01 | Supplying Fixing Of Mitsubishi Double Cab Full Canopy | | 185000.00 | 198000.00 | 192000.00 |
| 02 | Bed Liner | | 22000.00 | 28000.00 | 23000.00 |
| 03 | Door Visor | | 7000.00 | 8000.00 | 8000.00 |
| 04 | 3 rd Mirror | | 7500.00 | 8600.00 | 8500.00 |
| | Sub Total | | 221500.00 | 242600.00 | 231500.00 |
| | 11% Vat | | 24365.00 | 26686.00 | 25465.00 |
| | Total | | 245865.00 | 269286.00 | 256965.00 |

**7:2:8** වායු සමීකරණ පද්ධතිය අලුත්වැඩියා කිරීම සඳහා මිලදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර තාක්ෂණ සේවා නිළධාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිළ ගණන් අතරින් අවම මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.

| **අංකය** | **ද්‍රව්‍ය හා උපකරණ විස්තරය** | **ප්‍රමාණය** | **සිවිස්කුල් ඔටෝ සර්විස්** |
|---|---|---|---|
| 01 | වායු සමීකරණ පද්ධතිය අලුත්වැඩියා කිරීම | | 11500.00 |

**7:2:9 පරිගණක අලුත්වැඩියාව සඳහා මිළ ගණන් කැඳවන ලද අතර ගණකාධිකාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිළ ගණන් අතරින් අවම මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | LJS Comouter Center | Shakir Computer | Shiva Computer |
|---|---|---|---|---|---|
| 01 | Mother Board | 01 | 7500.00 | 7800.00 | 8200.00 |
| 02 | Sinhala Key Board | 01 | 700.00 | 750.00 | 750.00 |
| 03 | Install Printer | 01 | 680.00 | 720.00 | 1000.00 |

**7:2:10 විධායක පුටු සඳහා මිළ ගණන් කැඳවන ලද අතර විධායක පුටු මිළදී ගැනීමට පෙර තත්ව පරීක්ෂණයක් සිදු කළ යුතු බැව් තීරණය වූ බැවින් ලේකම්,ගණකාධිකාරී සහ තාක්ෂණ සේවා නිළධාරීන්ගෙන් සැදුම්ලත් කමිටුවක් මේ සඳහා පත් කරන ලදී.**

## (08) ගෙවීම්

8.1 ඇ. අංක 1164 යටතේ ගබඩාවට 650 x 16 ප්‍රමාණයේ පිටුපස ටයර් 02 හාඩ්මෙක් අත්ට්‍රැක්ටරය සඳහා මිලදී ගැනීම වෙනුවෙන් ගාල්ල විජේතුංග ටයර් සර්විස් පුද්ගලික සමාගම වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 23300.00 ක මුදලක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

11650.00 x 02 = 23300.00

8. 2 ඇ. අංක 1178 යටතේ ගබඩාවට භාණ්ඩ මිලදී ගැනීම වෙනුවෙන් අම්බලන්ගොඩ රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු.23175.00 ක මුදලක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

පැන්සල් 25 = 25 x 7.00 = 175.00

ඒ4 පැකට් 50 = 50 x 460.00 = 23000.00

= 23175.00

8.3 ඇ. අංක 1180 යටතේ ගබඩාවට මුද්‍රිත ලිපි ද්‍රව්‍ය,ලේඛණ මිලදී ගැනීම වෙනුවෙන් අම්බලන්ගොඩ අම්බලන්ගොඩ සක්වා ප්‍රින්ටර්ස් ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 176700.00 ක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

(1) ලියුම් කවර 9 x 4 = 4000 x 2.20 = 8800.00

(2) ලියුම් කවර 6 x3 ½ = 4000 x 0.95 = 3800.00

(3) ලියුම් කවර 15 x 10 = 4000 x 11.50 = 46000.00

(4) ලියුම් කවර 9 x 4 (සුදු) = 500 x 2.20 = 1100.00

(5) ලියුම් කවර 10 x6 ` = 400 x 6.75 = 27000.00

(6) ලිපි ශීර්ෂ පොත් (සාමාන්‍ය) =250 x 225.00 = 56250.00

(7) ලිපි ශීර්ෂ පොත් (විශේෂ) = 50 x 675.00 = 33750.00

=176700.00

8.4 ඇ. අංක 1181 යටතේ ගබඩාවට ගබඩා භාණ්ඩ මිලදී ගැනීම වෙනුවෙන් අම්බලන්ගොඩ රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 12900.00 ක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

CR පොත් (පිටු 200) 36 x 150.00 = 5400.00

නිල් පෑන් 500 x 15.00 = 7500.00

=12900.00

8.5 ඇ. අංක 1183 යටතේ 2014.12.29 වන දින ගබඩාවට LP Gas 37.5 kg ප්‍රමාණයේ සිලින්ඩර් 08 ක් මිලදී ගැනීම වෙනුවෙන් අම්බලන්ගොඩ මිළිඳු එන්ටර් ප්‍රයිසස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 49920.00 ක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

රු. 6240.00 x 8 = 49920.00

8.6 ඇ. අංක 1184 යටතේ ගබඩාවට ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් අම්බලන්ගොඩ සක්වා ප්‍රින්ටර්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 20125.00 ක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

(1) ෆයිල් කවර (නිල්) 750 x 11.50 = 8625.00

(2) ෆයිල් කවර (කහ) 500 x 11.50 = 5750.00

(3) ෆයිල් කවර (දුඹුරු) 500 x 11.50 = 5750.00

= 20125.00

8.7 ඇ. අංක 1185 යටතේ ගබඩාවට මුද්‍රිත ලේඛන මිලදී ගැනීම වෙනුවෙන් අම්බලන්ගොඩ සක්වා ප්‍රින්ටර්ස් ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 61400.00 ක මුදලක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

1. ලිපි බෙදා හැරීමේ පොත් 25 x 590.00 = 14750.00

2. පුස්තකාල සමාජික කාඩ් පත් 2000 x 3.75 = 7500.00
3. පුස්තකාල දින පත්‍රිකා 2500 x 1.75 = 4375.00
4. පුස්තකාල සාමාජික ලේඛණ 05 x 2450.00 = 12250.00
5. පුස්තකාල ප්‍රමාද ගාස්තු ලේඛන 05 x2650.00 = 13250.00
6. පරිග්‍රහන ලේඛන 02 x3450.00 = 6900.00
7. අහල් 9 x4 ලියුම් කවර (සුදු) 500 x 4.75 = 2375.00

= 61400.00

8.8 ඇ. අංක 1186 යටතේ 2015.01.06 වන දින ගබඩාවට LP Gas 37.5 kg ප්‍රමාණයේ සිලින්ඩර් 08 ක් මිලදී ගැනීම වෙනුවෙන් අම්බලන්ගොඩ මිළිඳු එන්ටර් ප්‍රයිසස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 49920.00 ක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

රු. 6240.00 x 8 = 49920.00

8.9 2014 නොවැම්බර් මාසයට අදාල විදුලි බිල්පත් සඳහා සී/ස ලංකා විදුලි (පුද්ගලික) සමාගමට ගෙවීම.

| වැය අංකය | ගෙවූ මුදල |
|---|---|
| 11453 -I | 56360.66 |
| 23453- I | 1845.36 |
| 34453- I | 2274.45 |
| 52453- I | 41289.29 |
| 53454 | 16695.75 |
| 62453- I | 22817.96 |
| එකතුව | 141283.47 |

විදුලි බිල්පත සඳහා රු.141283.47 ක මුදලක් ලේකම්ගේ නිර්දේශයෙන් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.10 2014 නොවැම්බර් මාසයට අදාල ජල බිල්පත් සඳහා ජාතික ජල සම්පාදන මණ්ඩලයට ගෙවීම.

| වැය අංකය | ගෙවූ මුදල |
|---|---|
| 11453 -I I | 9688.00 |
| 23453- I I | 12862.84 |
| 34453- I I | 1002.40 |
| 52453- I I | 8435.10 |
| 62453- I I | 48311.24 |
| එකතුව | 80299.58 |

ජල බිල්පත සඳහා රු.80299.58 ක මුදලක් ලේකම්ගේ නිර්දේශයෙන් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.11 2014 නොවැම්බර් මාසයට අදාල දුරකථන බිල්පත් සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට ගෙවීම.

| වැය අංකය | ගෙවූ මුදල |
|---|---|
| 11452 | 26395.89 |
| 12452 | 1211.73 |
| 25451 - I I | 1704.80 |
| 62452 - I | 7400.51 |
| එකතුව | 36712.93 |

දුරකථන බිල්පත සඳහා රු.36712.93 ක මුදලක් ලේකම්ගේ නිර්දේශයෙන් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:12 අදාළ වවුචරය ඉදිරිපත් කරන ලද මන්ත්‍රීවරුන්ගේ නොවැම්බර් මසට අදාලව ගමන් වියදම් ලෙස රු.2400.00ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:13 2015 වර්ෂයේ අය වැය ලේඛණය සකස් කිරීමේ කටයුතු සඳහා වර්ණ පිටපත් 750 ක් ලබා ගැනීම වෙනුවෙන් එල්.එස්.ජේ. කම්පියුටර් සෙන්ටර් ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 26250.00 ක් ගෙවීම ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

35.00 x 750 = 26250.00

8:14 කා.නි. අංක 0356 යටතේ පෙර පාසල් උත්සවය සඳහා සහ ක්‍රීඩා උළෙල සඳහා කලර් ලයිට් යොදා ගැනීම වෙනුවෙන් උපේන්ද්‍ර ඉලෙක්ට්‍රික්ස් ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 12000.00 ක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:15 2014 වර්ෂයේ ඔක්තෝම්බර් ,නොවැම්බර් හා දෙසැම්බර් මාස සඳහා මුද්දර බදු ලෙස දේශීය ආදායම් කොමසාරිස් වෙත ලේකම් නිර්දේශයෙන් රු.21454.00 ක මුදලක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:16 2014 වර්සයේ 4 වන කාර්තුව සඳහා රු.2937.69 ක මුදලක් ලේකම් නිර්දේශයෙන් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙතින් ලබා ගැනීමට හෝ හිලව් කිරීමට ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:17 අම්බලන්ගොඩ නගර සභාව මඟින් පාලනය වන පුස්තකාලට 2014 දෙසැම්බර් මස සඳහා සපයන ලද පුවත් පත් වෙනුවෙන් එම්.එස්. වීරසිංහ මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු.26865.00 ක මුදලක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

- **ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා ප.ව.12.05 ට පමණ ගරු සභාවෙන් මදකට පිටව යන ලදී.**

8:18 නගර සභාව සතු 252 -0730 කැබ් රථය සඳහා 2014 දෙසැම්බර් මස 01-20 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 33445.00 ක මුදලක් තාක්ෂණ සේවා නිළධාරීගේ හා ලේකම්ගෙ නිර්දේශය මත , සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා ගැනීම.

මෙම ගෙවීම සම්බන්ධයෙන් විරෝධතාවයන් මතු වූ බැවින් මේ සම්බන්ධයෙන් ජන්දය විමසන ලදී.

ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා,ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහාන් මහතා, ගරු නගර සභා මන්ත්‍රී බී.ජනිත් වික්‍රමතිලක මහතා සහ ගරු නගර සභා මන්ත්‍රී කේ.පුෂ්පික ඉන්ද්‍රජිත් මහතා මෙම ගෙවීම අනුමත කිරීමට විරුද්ධව ජන්දය ලබා දුන් අතර ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා , ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා , ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා මෙම ගෙවීමට පක්ෂව ජන්දය ප්‍රකාශ කළ අතර ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා , ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.හාෂිණි මෙනුකා විජේසූරිය මහත්මිය, ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා සහ ඒ.පී.ලක්ෂ්මි හේමන්තා මෙනවිය මෙම අවස්ථාවේදී සභා ගර්භයේ රැදී නොසිටින ලදී.

ඒ අනුව සභාපතිතුමාගේ තීරක ජන්දය සමඟින් මෙම ගෙවීම වැඩි ඡන්ද එකකින් සම්මත වන ලදී.

- **ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී.ලක්ෂමි හේමන්තා සිල්වා මෙනවිය, ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා සහ ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා ගරු සභාවට නැවතත් පැමිණෙන ලදී.**

8:19 නගර සභාව සතු LF 1853 ටිපර් රථය සඳහා 2014 දෙසැම්බර් මස 01-20 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 24148.00 ක මුදලක් තාක්ෂණ සේවා නිළධාරීගේ හා ලේකම්ගෙ නිර්දේශය මත , සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:20 නගර සභාව සතු නව ඩ්‍රම් ට්‍රක් රථය සඳහා 2014 දෙසැම්බර් මස 01-20 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 11100.00 ක මුදලක් තාක්ෂණ සේවා නිළධාරීගේ හා ලේකම්ගෙ නිර්දේශය මත , සී/ස අම්බලන්ගොඩ

විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:21 නගර සභාව සතු PF 7424 කැබ් රථය සඳහා 2014 දෙසැම්බර් මස 01-20 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 18780.00 ක මුදලක් තාක්ෂණ සේවා නිළධාරීගේ හා ලේකම්ගෙ නිර්දේශය මත , සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:22 නගර සභාව සතු 49-9421 ට්‍රැක්ටරය සඳහා 2014 දෙසැම්බර් මස 01-20 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 17128.00 ක මුදලක් තාක්ෂණ සේවා නිළධාරීගේ හා ලේකම්ගෙ නිර්දේශය මත , සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:23 නගර සභාව සතු 49-9422 ට්‍රැක්ටරය සඳහා 2014 දෙසැම්බර් මස 01-20 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 11199.00 ක මුදලක් තාක්ෂණ සේවා නිළධාරීගේ හා ලේකම්ගෙ නිර්දේශය මත , සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:24 නගර සභාව සතු RA 3709 ට්‍රැක්ටරය සඳහා 2014 දෙසැම්බර් මස 01-20 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 12132.00 ක මුදලක් තාක්ෂණ සේවා නිළධාරීගේ හා ලේකම්ගෙ නිර්දේශය මත , සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:25 නගර සභාව සතු RA 8796 ට්‍රැක්ටරය සඳහා 2014 දෙසැම්බර් මස 01-20 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 11166.00 ක මුදලක් තාක්ෂණ සේවා නිළධාරීගේ හා ලේකම්ගෙ නිර්දේශය මත , සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:26 නගර සභාවේ සතු GL-9369 ගලි බවුසරය සඳහා 2014 දෙසැම්බර් මස 01-20 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 15090.00 ක මුදලක් තාක්ෂණ සේවා නිළධාරීගේ හා ලේකම්ගෙ නිර්දේශය මත , සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:27 නගර සභාව සතු 252 -0730 කැබ් රථය සඳහා 2014 දෙසැම්බර් මස 20-31 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 17316.00 ක මුදලක් තාක්ෂණ සේවා නිළධාරීගේ හා ලේකම්ගෙ නිර්දේශය මත , සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:28 නගර සභාව සතු PF 7424 කැබ් රථය සඳහා 2014 දෙසැම්බර් මස 20-31 දින දක්වා ලබාගත් ඉන්ධන

වෙනුවෙන් රු. 24915.00 ක මුදලක් තාක්ෂණ සේවා නිළධාරීගේ හා ලේකම්ගෙ නිර්දේශය මත , සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:29 නගර සභාව සතු නව ඩ්‍රම් ට්‍රක් රථය සඳහා 2014 දෙසැම්බර් මස 20-31 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 11100.00 ක මුදලක් තාක්ෂණ සේවා නිළධාරීගේ හා ලේකම්ගෙ නිර්දේශය මත , සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:30 2014 පළාත් නිශ්චිත සංවර්ධන වැඩ සටහන යටතේ ධීරක්කන්ද පාර ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තයේ අතිරේක වැඩ වෙනුවෙන් රු.32737.50 ක මුදලක් ලේකම්ගේ නිර්දේශයෙන් අංක 83 කරිත්ත කන්ද ප්‍රජා මණ්ඩලය වෙත ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:31 හිරිකැටිය හරස් පාර අතුරු මාර්ගය හා කානුව කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය වෙනුවෙන් රු.390523.04 ලේකම්ගෙ නිර්දේශය මත , අංක 83,හෙප්පුමුල්ල සමගි ප්‍රජා මණ්ඩලය වෙත ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:32 පීරිස් වෙද මාවත වරිපනම් අංක 3 B/2 නිවස අසලින් යන මාර්ගය කුට්ටි ගල් අතුරා සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ 10% ක රැඳවුම් මුදල වන රු.15050.31 ක මුදලක් ලේකම්ගෙ නිර්දේශය මත අංක 83,හෙප්පුමුල්ල සමගි ප්‍රජා මණ්ඩලය වෙත ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:33 ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදයේ 2015 වර්ෂයේ සමාජික මුදල වන රු.10000.00 ක මුදල ලේකම්ගේ නිර්දේශයෙන් ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදය වෙත ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.34 නගර සභාව මඟින් පාලනය වන පෙර පාසල් ළමුන්ගේ නිළ ඇඳුම් මැසීමේ කුලිය වෙනුවෙන් එක් ළමයකුට රු.200.00 බැගින් ළමුන් 162 ක් සඳහා ලේකම්ගේ නිර්දේශය පරිදි සභා ආවරණ අනුමැතියට යටත්ව රු. 32400.00 ක මුදලක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.35 2015 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම වෙනුවෙන් සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම වෙත සභා ආවරණ අනුමැතියට යටත්ව ලේකම්ගේ නිර්දේශය පරිදි රු.71820.00 ක මුදලක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.36 පනියන්දුව පාලම ඉදිකිරීමට අධි වෝල්ටීයතා විදුලි කණුවේ පිහිටීම වෙනස් කිරීම වෙනුවෙන් සී/ස ලංකා විදුලි (පුද්ගලික) සමාගම විසින් එවන ලද ඇස්තමේන්තු මුදල වන රු.92325.20 ක මුදලක් ලේකම්ගේ නිර්දේශයෙන් සී/ස ලංකා විදුලි (පුද්ගලික) සමාගම වෙත ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:37 කසල අවසන් බැහැරලන ස්ථානයේ කසල තුනී කිරීමට D4E යන්ත්‍රයේ සේවය ගබා ගැනීම වෙනුවෙන් විස්කම් කොන්ක්‍රීට් වර්ක්ස් (පුද්ගලික) සමාගම වෙත ලේකම් නිර්දේශයෙන් රු.203100.00 ක මුදලක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:38 ලෝක ශූරතාවය දිනූ ක්‍රිකට් ක්‍රීඩකයන්ට උපහාර දැක්වීමේ උත්සවයේ ඇල්බමය සැකසීම වෙනුවෙන් එස්.එන්.හෙන්දහේවා මහතා වෙත ලේකම් නිර්දේශයෙන් රු.8325.00 ක මුදලක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:39 2015 වර්ෂයට අදාල තක්සේරු දැන්වීම් පත්රිකා 8938 බෙදාහැරීම වෙනුවෙන් එම දැන්වීම් පත්‍රිකා බෙදා හළ පුද්ගලයින් වෙත දපපා/පපාකො/2013/01 දරණ චක්‍ර ලේඛයට අනුව ලේකම් නිර්දේශයෙන් රු.35752.00 ක මුදලක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

## (09) ගිණුම්

**9.1** 2014 දෙසැම්බර් මාසය සඳහා වියදම් වාර්තාව , වියදම් වැය විශ්ලේශණය, පොදු ගිණුම , මුදල් සාරාංශය හා ලැබීම් විග්‍රහය සභාගත කිරීම.

ඒ අනුව 2014 දෙසැම්බර් මස ගිණුම් වාර්තා පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභාවේ ස්ථිර විය.

**(10)** weia;fïka;=

10:1) පටබැදිමුල්ල සුසාන භූමියේ අතුරු මාර්ගයේ කුට්ටි ගල් ඇතිරීමේ හා මල් පාත්ති ඉදි කිරීමේ කර්මාන්තය වෙනුවෙන් තාක්ෂණ සේවා නිළධාරී විසින් සකස් කරන ලද රු.1416645.72 ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ් .අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:2) හෙප්පුමුල්ල සේවා පියස ඉදිරිපිට කාණු කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය වෙනුවෙන් තාක්ෂණ සේවා නිළධාරී විසින් සකස් කරන ලද රු.224827.02 ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ් .අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:3) පින්නදූව මාර්ගයේ කාණු ඉදිකිරීමේ කර්මාන්තය වෙනුවෙන් තාක්ෂණ සේවා නිළධාරීනිය විසින් සකස් කරන ලද රු.820666.75 ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ් .අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:4) සුදුවැල්ල පාරේ 2 වන හරස් පාර ඉදිකිරීමේ කර්මාන්තය වෙනුවෙන් තාක්ෂණ සේවා නිළධාරිණිය විසින් සකස්කරන ලද රු. 251321.22 ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ් .අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:5) ලිදමුල්ලවත්ත මාර්ගයේ කුට්ටි ගල් ඇතිරීමේ කර්මාන්තය වෙනුවෙන් තාක්ෂණ සේවා නිළධාරිණිය විසින් සකස්කරන ලද රු. 584637.80 ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ් .අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

(11) fjk;a lreKq

**11:1** ' ට්‍රැක්ටර් ටේලර් අමතර කොටස් මිලදී ගැනීම සම්බන්ධවයි ' මැයෙන් සැපයුම් නිළධාරී විසින් එවා තිබූ ලිපිය සභාගත කිරීම.

ට්‍රැක්ටර් ටේලර් අමතර කොටස් මිලදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද බවත් 2015.01.06 මාසික සභාවට යොමු කර අවම මිල ගණන් සඳහා අනුමැතිය ලැබී ඇති බවත් ,නමුදු එක් එක් අයිතම සඳහා ආයතන 4 ම අවම මිළ ගණන් ලැබී ඇති බවත් මෙම උපකරණ ඒ ඒ ආයතනයෙන් මිළ දී ගැනීමේදී ගැටලු මතු විය හැකි බැවින් මිළ දී ගැනීම් සම්බන්ධ අවශ්‍ය උපදෙස් ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මෙතන තියෙනවා භාණ්ඩ සියල්ලකම මුළු වටිනාකම අඩුම අගයක් ගන්න ස්ථානයෙන් ගන්න අනුමැතිය ඉල්ලලා තියෙනවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ට්‍රැක්ටර් හදන්න පරක්කු වෙලා තියෙන්නේ. ට්‍රැක්ටර් දුවන්න විදියක් නැතිව ඉන්නේ.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් තාක්ෂණ සේවා නිළධාරීගේ නිර්දේශය පරිදි ට්‍රැක්ටර් ටේලර් අමතර කොටස් මිලදී ගැනීමේදී මිලදීගත යුතු සියලූම අමතර කොටස් වල එකතුව අවම අගයක් වන ආයතනයෙන් මෙම අමතර කොටස් මිලදී ගැනීම සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:2** ' 2014 දෙසැම්බර් මස වාර්තාව' මැයෙන් අම්බලන්ගොඩ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ ඖෂධ සංයෝජක විසින් ඒවා තිබූ වාර්තාව සභාගත කරන ලදී.

ආයතනයෙහි සායන පැවැත්වූ දින ගණන 20 ක් බවත්,ආයතනයට පැමිණි රෝගීන් සංඛ්‍යාව 238 ක් බවත් , රෝගීන් පැමිණීමේ දෛනික සාමාන්‍ය 12 ක් බවත්, මාසය සඳහා වැය වූ ඖෂධ වල මුළු වටිනාකම රු.24158.75 ක් බවත් , රෝගියෙක් සඳහා වැය වූ මුදල රු.101.50 ක් බවත් සඳහන් කර තිබුණි.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් නිදහස් ආයුර්වේද බෙහෙත්ශාලාවේ දෙසැම්බර් මස වාර්තාව සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**(12)** **න්‍යාය පත්‍රයට ඇතුලත් නොවූ වෙනත් කරුණු**

**12:01** " ක්‍රීඩාංගනය වෙන් කරවා ගැනීම'' මැයෙන් දප/අම්/ග්‍රාමිණී විද්‍යාල විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

විද්‍යාලය ඉදිරිපිට ඇති ක්‍රීඩා පිටිය ඉදිරි දින වල ක්‍රීඩා තරඟ පැවැත්වීම සහ පුහුණු කිරීමේ කටයුතු කිරීම සඳහා සැලසුම් කර ඇති බැවින් 2015.02.10 දින සිට 2015.02.20 දින දක්වා කාල සීමාව විද්‍යාලයීය දරුවන් සඳහා යවන් කිරීමට අවශ්‍ය කටයුතු කරනදන මෙන් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් 2015.02.10 වන දින සිට 2015.02.20 වන දින දක්වා ග්‍රාමිණී විද්‍යාලය ඉදිරිපිට ඇති ක්‍රීඩා භූමිය ග්‍රාමිණී විද්‍යාලයේ ක්‍රීඩා තරඟ සහ ක්‍රීඩා පුහුණු විම් සඳහා ලබා දීමට ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:02** "තණ කොළ කපන යන්ත්‍රය අලුත්වැඩියා කිරීම" මැයෙන් වැඩ පරිපාලක ඇල්ටන් මහතා විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

තණ කොළ කපන මැෂිම අබලන්ව ක්‍රියා විරහිතව ඇති බවත් එම යන්ත්‍රය සම්පූර්ණයෙන් අලුත්වැඩියා කිරීම සඳහා පිගාරෝ ආයතනයට ලබා දී ඇති බවත් ඒ සඳහා එම ආයතනයෙන් රු.16348.86 ඇස්තමේන්තුවක් එවා ඇති බවත් ,මෙම අලුත්වැඩියා කිරම සඳහා උපදෙස් හා අනුමැතිය ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් තණ කොළ කපන මැෂිම පිගාරෝ ආයතනයෙන් ලබා දී ඇති රු.16348.86 ක ඇස්තමේන්තුවට අනුව අලුත්වැඩියා කර ගැනීමට ගරු සභාවේ අනුමැතිය ලබා දෙ ලදී.**

**12:03** "පරිගණක සහතික පත්‍ර පාඨමාලාව " මැයෙන් පළාත් පාලනය පිළිබඳව ශ්‍රී ලංකා ආයතනය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

අභිනව රජයේ දින 100 වැඩ සටහනට සමගාමීව පළාත් පාලන ආයතන වල නියෝජිතයන්ගේ සහ නිළධාරී මහත්ම මහත්මීන්ගේ තොරතුරු තාක්ෂණික දැණුම වර්ධනය කිරීම සඳහා පරිගණක සහතික පත්‍ර පාඨමාලාවක් සංවිධානය කර ඇති බවත්, මාස 3 ක කාලයක් පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ මෙම වැඩ සටහන පැවැත්වෙන බවත් මේ සඳහා ගාස්තුව රු.15000.00 ක් බවත් එය අදාළ පළාත් පාලන ආයතනය මඟින් ගෙවිය යුතු බවත් සඳහන් කර තිබුණි.

<u>ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>

සභාපතිතුමණි,කොළඹ කැම්පස් එකේ පබ්ලික් මැනේර්ජ්මන්ට් ඇන්ඩ් ගවර්මන්ට් පාඨමාලාව මීට මාස 03 කට කලින් සභා නියෝජිතයන්ට යාමට සහ පරිපාලන නිළධාරීන්ට යාමට අවස්ථාව තියෙනවා කියලා ප්‍රකාශයට පත් කළා.මේ සම්බන්ධයෙන් පෞද්ගලිකව මම ඉල්ලීම් කළා.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

පාඨමාලාවට සම්පූර්ණ ගාණ කීයද?

<u>ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>

අසූදාහක්, අනූදාහක් විතර වෙයි සභාපතිතුමණි.මේක උසස් අධ්‍යාපන පාඨමාලාවක් නිසා.වැය ප්‍රතිපූර්ණය කරනවා කියලා තමයි එතුමන්ලා කීවේ.මෙතෙක් ඒක සිද්ධ නොවුන නිසා මම බැලුවේ.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මන්ත්‍රීවරු විරුද්ධද මේකට?කිත්සිරි මන්ත්‍රීතුමා මේ පාඨමාලාව සඳහා ගාස්තු ප්‍රතිපූර්ණය කරන්න කියලා ඉල්ලනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්</u>

නගර සභාවේ කාලය තව සමකින් අවසන් වෙන නිසා මේ සම්බන්ධයෙන් වියදම් කිරීම නීතිානුකූලද කියලා බලලා කරන්න.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මම නම් කියන්නේ යම් මන්ත්‍රීවරයෙක්ගේ දැණුම වැඩි කිරීම සඳහා විශ්ව විද්‍යාලයකට ගිහිල්ලා ඉගෙනීමේ කටයුත්තක් කරනවනම් අපි ඒකට සහයෝගය ලබා දෙන්න ඕන.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්</u>

මම මීට පෙර මේ වගේ කිසිම දේකට විරුද්ධ වුනේ නෑ.මේ පෙබරවාරි මාසේ.ලබන්නේ මාර්තු මාසේ.එනිසා නීතිානුකූල බව බලලා කරන්න.මේක සභාවට දැම්මේ අදනේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>

මේක සභාවේ අනුමත කරලා තියෙනවා.අනුමත කරපු එක වැය ශීර්ෂ යටතේ සඳහන් කරපු නැති නිසා තමයි මම කීවේ.ගිය වසරේ මැයි මාසේ වාර්තාවේ තියෙනවා.නැවත මේ ජනවාරි මාසේ සභාවෙත් සඳහන් වෙලා තියෙනවා.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මගේ පෞද්ගලික මතය නම් මන්ත්‍රීවරයෙක්ගේ දැණුම වර්ධනය කරගන්න අවස්ථාවක් තියෙනවනම් අපි ඒකට උදව් කරන්න ඕන.අනෙක් මන්ත්‍රීවරු මොකද කියන්නේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>

පුද්ගලිකව මට මේක දරන්න වීම ගැටලුවක් නෙවෙයි.නමුත් සභාවේ අනුමත වීම තුළ මම සැහැල්ලුවෙන් මේකට ලියාපදිංචි වුණා.ගිය වසරේ සැප්තැම්බර් මස මට මේක යොමු කළේ.අදටත් ඒක ක්‍රියාත්මක නොවීම නිසා තමයි මම මතක් කළේ.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මන්ත්‍රීවරු විරුද්ධද?නැතිනම් අපි අනුමත කරනවා.අදාල වවුවරය විශ්ව විද්‍යාලයට ඉදිරිපත් කරන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහන් ද සිල්වා මහතා කතා කරමින්</u>

පරිගණක සහතික පත්‍ර පාඨමාලාව සියලුම මන්ත්‍රීවරුන්ට කාලෝචිත අවස්ථාවක්.නමුත් මේ සියලුම දෙනා කාර්යය බහුල ජීවිතයක් ගතකරන්නේ.ඉල්ලීමක් කරන්නවා පුලුවනි නම් අම්බලන්ගොඩ ප්‍රදේශයේ මේ වගේ පාඨමාලාවක් කරන්න හදලා දෙන්න.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ ආයතනය පළාත් පාලනය පිළිබඳ ලංකා ආයතනයක්.මේකට ගිහිල්ලා ඉගෙන ගන්න එක හොඳයි.අපට පුලුවන් ඔය ඉල්ලීම ඕපන් යුනිවර්සිටි එකෙන් ඉල්ලන්න.නමුත් අපට මේක කොයි තරම් ගැලපෙනවද කියන එක තමයි ප්‍රශ්නය.ලේකම්තුමා විමසීමක් කරලා බලන්න ඕපන් යුනිවර්සිටි එකෙන් මේ වගේ යෝජනාවක් තියෙනවා කියලා.හැබැයි යන්න ඕන.නැතිනම් අපරාධයක් වෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා කතා කරමින්**

අපේ සියලුම මන්ත්‍රීවරු මේ සඳහා සහභාගී වෙනවනම් සභාවේ වාහනයක් කතා කරගෙන මේ සඳහා අපට යන්න පුලුවන්නේද.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහන් ද සිල්වා මහතා කතා කරමින්**

යන එක නොවෙයි ගැටලුව.අපි සියලු දෙනාම ව්‍යාපාරිකයින්.කාර්යය බහුල උදවිය.ඉතින් මේ සඳහා යන්න එන්න පැය ගානක් වැය කරන්න අපට බැහැ.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ලේකම් මහත්තයා මේ සම්බන්ධයෙන් විමසලා ලබන සභාවට යොමු කරන්න.

තීරණය

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මේ සඳහා කැමැත්ත ඇති මන්ත්‍රීවරුන්ට මෙම පාඨමාලාව සඳහා සහභාගී වීමට ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:04** “දුරකථන දීමනාව ලබා ගැනීම- වැඩ බලන මහජන සෞඛ්‍ය පරීක්ෂක -පී.එස්.එස්.ද සිල්වා මයා ” මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

මහජන සෞඛ්‍ය පරීක්ෂක පී.එස්.එස්.ද සිල්වා මහතාගේ 2015.01.22 දිනැති ලිපියෙන් එම තනතුරේ වැඩ බැලීම වෙනුවෙන් ඔහුගේ පෞද්ගලික දුරකථන අංක 091-2856968 භාවිතා කිරීම වෙනුවෙන් රු.750.00 ක දීමනාවක් ඉල්ලා සිටින බවත් පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ පපාසකො/ගා/ආ/01/02/08 හා 2015.02.09 දිනැති ලිපියට පිළිතුරු සැපයීමට විධිමත් සභා තීරණයක් අවශ්‍ය බැවින් මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ 0912856968 දුරකථනය සඳහා රු.750.00 ක දුරකථන දීමනාවක් ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

තීරණය

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතාට රාජකාරී කටයුතු සඳහා ඔහුගේ පෞද්ගලික දුරකථනය වන 0912856968 භාවිතා කිරීම වෙනුවෙන් මසකට රු.750.00 ක දුරකථන දීමනාවක් ලබා දීම සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

☞

**12:05** “මහ නැඟුම ග්‍රාමීය සංවර්ධන වැඩසටහන - 2015 දින සියය ප්‍රමුඛතා සංවර්ධන වැඩ සටහන ” මැයෙන් මහා මාර්ග,උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

මහ නැඟුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩ සටහන යටතේ 2015 වර්ෂයේ දින 100 ප්‍රමුතා සංවර්ධන වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කැඳවීමට අදාළ උපදෙස් තවදුරටත් සංශෝධන සිදු කෙරෙමින් පවතින බැවින් ,නැවත දැණුම් දෙනතුරු 2015.01.20 දිනැති ලිපිය සමඟ එවූ ආකෘති පත්‍ර සම්පූර්ණ කර නොඑවන මෙන් දන්වා තිබුණි.

<u>තීරණය</u>

☞ **මෙය ගරු මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:06** “අම්බලන්ගොඩ නගර සභාවේ ජංගම ගිණුම් අංක 035-1-001-2-6295234 යටතේ බැංකු අයිරා පහසුකම් ලබා ගැනීම ” මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

මෙම ජංගම ගිණුම යටතේ රු.750000.00 ක බැංකු අයිරා පහසුකමක් අත්‍යාවශ්‍ය ගෙවීම් කිහිපයක් කිරීමට සභා ආවරණ අනුමැතිව යටත්ව ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභා ආවරණ අනුමැතියට යටත්ව අනුමැතිය ලබා දී තිබූ රු.750000.00 බැංකු අයිරා පහසුකම ලබා ගැනීම වෙනුවෙන් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

☞

**12:07** “2013.04.02 වන දින සභා ගත කරන ලද දළුක්කන්ද පාරේ අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය ” මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපි ගොනුව සභාගත කරන ලදී.

මෙම යෝජනාව සඳහා ප්‍රාදේශීය ලේකම් මඟින් මුහුදු වැලි සපයාගෙන ගල් හා සිමෙන්ති නගර සභාවෙන් සපයා නගර සභාවේ සේවකයන් මඟින් මෙම කර්මාන්තය කිරීමට සබා අනුමැතිය ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මෙම කර්මාන්තය සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:08** නො.11 ජී, ගාලූ පාර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි ලලිත් හැලඹගේ මහතා විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ දොළොස් මහේ ප්‍රදර්ශනාගාරයට 2015 නව වසර වෙනුවෙන් ජනතාව නන් දෙසින් පැමිණෙන බැවින් අව්වෙන් සහ වැස්සෙන් ආරක්ෂා වීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට සහ අවට නිවැසියන්ට අවහිර

නොවන පරිදි යකඩ පයිප්ප සම්බන්ධකොට තාවකාලික සෙවනක් ලබා දීමට අවශ්‍ය බැවින් ඒ සඳහා අවසර ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

මේක පුද්ගලික දෙයක් විදියට කරලියට ආවත්,මේ වෙළඳ ව්‍යාපාරය යටතේ විශාල පිරිසක් අම්බලන්ගොඩ ප්‍රදේශයට අවුරුදු සමයේ එනකොට ගිය වසර වල වගේ ආවරණයක් සකස් කර ගැනීමට අවසර ඉල්ලා තියෙන්නේ.මෙය අපේ සියලුම මාර්ග වලට යොදනවනම් හොඳයි කියලා හිතෙනවා මේ පියස්ස යටින් යනකොට.මෙය සමස්ථ පාරිභෝගිකයන්ට සේවයක් සැපයෙනවා.මම පුද්ගලිකව හිතනවා නගර සභාවේ අවශ්‍යතාවය මත ගලවා ඉවත් කිරීමේ හැකියාව සහ අපේ අනන්‍යතාවය රැකෙන පරිදී මාර්ගය අවහිර නොවන ආකාරයට ,බාහිර වෙළඳ ව්‍යාපාර මේ තුළ ගොනු නොවන ආකාරයට මේක වර්ෂය පුරාම සකස් කරලා තියන්න පුලුවන් නම් ,අපට එහෙම අනුමැතිය ලබා දෙන්න පුලුවන්නම් හොඳයි කියලා මම හිතනවා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
මේ සඳහා විරුද්ධ අය ඉන්නවද?

**<u>තීරණය</u>**

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් යකඩ පයිප්ප සම්බන්ධකොට තාවකාලික සෙවනක් සැකසීම සඳහා දොළොස්මහේ ප්‍රදර්ශනාගාරයට අවසර ලබා දීමට ගරු සභාව තීරණය කරන ලදී.**

**12:09** "කාය වර්ධන මධ්‍යස්ථානය සඳහා උපදේශකවරයකුගේ සේවය ලබා ගැනීමේ ව්‍යාපෘතිය - අම්බලන්ගොඩ නගර සභාව" මැයෙන් ප්‍රජා සංවර්ධන නිළධාරිනිය විසින් ඉදිරිපත් කර තිබූ ව්‍යාපෘති වාර්තාව සභාගත කරන ලදී.

කාය වර්ධන මධ්‍යස්ථානය සඳහා උපදේශකවරයකු බඳවා ගැනීමේ ඇති වැදගත්කම ,එහි අභිමතාර්ථ ,අරමුණු ආදිය පැහැදිලි කර තිබූ අතර ව්‍යාපෘතිය මඟින් ඉටුකිරීමට යෝජිත කාර්යයන් පිළිබඳව සඳහන් කර තිබූ අතර කාය වර්ධන මධ්‍යස්ථානය සඳහා උපදේශකවරයකු බඳවා ගැනීම සඳහා අවශ්‍ය සදුසුකම් පිළිබඳවද සඳහන් කොට තිබුණි.

**<u>තීරණය</u>**

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් කාය වර්ධන මධ්‍යස්ථානය සඳහා උපදේශකවරයකුගේ සේවය ලබා ගැනීමේ ව්‍යාපෘති වාර්තාව සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.;**

**12:10** "අංක SD/2014/208 දරණ පෝරමයේ විකිණීම මත අයකරන 1% ක් ගාස්තුව නිදහස් කර ගැනීම ''මැයෙන් අංක 23, පතිරාජ පාර , කෙරමිණිය, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි එම්.ඩබ්.බුද්ධදාස මහතා විසින් ඉදිරිපත් කර තිබූ දිවුරුම් ප්‍රකාශය සභාගත කරන ලදී.

තමන්ට අයිති හිමිකම් ඔප්පුවේ පිඹුරු අංක 32/78 ඒ පිඹුරේ නිරුපිත දේපලෙන් කොටසක් වන ලොට් අංක A එම්.ඩබ්.සම්පත් ප්‍රියදර්ශන යන පුතුටද , ලොට් අංක B එම්.ඩබ්.බුද්ධදාස වන තමන්ගේ නමින්ද, ලොට් අංක C එම්.ඩබ්.සංජීව ප්‍රියදර්ශන යන පුතුගේ නමින්ද ලොට් අංක D එම්.ඩබ්.බුද්ධදාස වන තමන්ගේ නමින්ද, ලොට් අංක E මාර්ගයද ලෙස පවතින බවත් කිසිදු කොටසක් විකිණීම හෝ පැවරීමක් සිදු කර නොමැති බවත් සඳහන් කර තිබූ අතර එබැවින් විකිණීම මත අය කරන 1% ක ගාස්තුව වන රු.67640.00 ක මුදලින් නිදහස් කර දෙන මෙන් ඉල්ලා තිබුණි.

තීරණය

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් අංක SD/2014/208 දරණ පෝරමයේ විකිණීම මත අයකරන 1% ක ගාස්තුව වන රු.67640.00 ක මුදල නිදහස් කිරීම වෙනුවෙන් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:11** ''ආදාහනාගාර දෙක සඳහා තණකොළ කපන මැෂිමක් මිළදී ගැනීම - සභා තීරණ අංක 12:2''මැයෙන් ප්‍රධාන ආදායම් කළමණාකරන සහකාර විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

2015.01.06 වන දින සභාවේ තීරන අංක 12:02 යටතේ ආදාහනාගාරයේ දිරාපත් වෙමින් පවතින යකඩ කොටස් විකිණීම සඳහා අනුමැතිය ලබා දුන් අතර ඒ අනුව ආදායම් පරීක්ෂකගේ සහ තාක්ෂණ සේවා නිළධාරීගේ නිර්දේශය පරිදි යකඩ කි.ලෝ.1 ක් රු.35.00 මුදලකට වෙන්දේසි කිරීම සුදුසු බව යෝජනා කර තිබූ අතර ඒ සඳහා අනුමැතිය ඉල්ලා තිබුණි.

තීරණය

☛ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ආදාහනාගාරයේ දිරාපත් වෙමින් පවතින යකඩ කොටස් කි.ලෝ.1 ක් රු.35.00 ක මිළකට වෙන්දේසි කිරීම සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:12** ''අංක SD/2015/05 දරණ ඉඩම් අනුබෙදුම් පෝරමයේ විකිණීම මත අය කරන 1% ගාස්තුව නිදහස් කර ගැනීම''මැයෙන් මහ අම්බලන්ගොඩ,අංක 93/1 ලිපිනයේ පදිංචි රන්කොත්ගේ චන්ද්‍රා කුමාරි විසින් ඉදිරිපත් කර තිබූ දිවුරුම් ප්‍රකාශය සභාගත කරන ලදී.

බලයලත් මිනින්දෝරු ජේ.පි. නිහාල් එම්.ද සිල්වා සහතාගේ අංක 1021 සහ 2014/09/15 දින මැන බෙදා වෙන් කරන ලද 2014/09/29 වන දින දරණ පිඹුර සකස් කර ඇති බවත් මෙම දේපල දරුවන් අතර බෙදා වෙන් කර දීමට අවශ්‍ය බවත් ඒ අනුව මෙම පිඹුරේ ඇති 4 ඒ ඉඩම් කැබැල්ල දොන් සීමන් පටබැඳි තරංග යන අයටද 4බී ඉඩම් කැබැල්ල දොන් සීමන් පටබැඳි සුරංගි යන අයටද 4සී ඉඩම් කැබැල්ල දොන් සීමන් පටබැඳි චිත්‍රාල් යන අයටද වන සේ දරුවන් 3 අතර බෙදා දීමට අදහස් කර සිටින බවත් කිසිදු විකිණීමක් සිදු නොවන බැවින් විකිණීම මත අය කරන 1% ගාස්තුව වන රු.53970.00 ක මුදලින් නිදහස් කර සදන මෙන් ඉල්ලා තිබුණි.

තීරණය

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් අංක SD/2015/05 දරණ අනුබෙදුමේ විකිණීම මත අයකරන 1% ක ගාස්තුව වන රු.53970.00 ක මුදල නිදහස් කිරීම වෙනුවෙන් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:13** **‘** 2015 ජනවාරි මස වාර්තාව**’** මැයෙන් අම්බලන්ගොඩ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ ඖෂධ සංයෝජක විසින් ඒවා තිබූ වාර්තාව සභාගත කරන ලදී.

